# 1967 ආර්ථික ප්‍රශ්න හා ප්‍රතිපත්ති

## හැඳින්වීම

1967 වර්ෂයේදී ආර්ථික තත්ත්වයෙහි විශිෂ්ඨ ලක්ෂණය වූයේ, මූර්ත නිමැයුමේ සිදුවූ සැලකිය යුතු පුළුල් වීමයි. ආර්ථිකයේ යහපත් හෝ අයහපත් හැඩගැස්ම ප්‍රධාන වශයෙන් අපනයන අංශයෙහි හැඩගැස්ම මත රැඳී පැවති, පසුගිය වර්ෂ වලදී මෙන් නොව, මේ වර්ෂයේදී සිදුවූ ආර්ථික කටයුතු වල පුළුල් වීමට මූලික වශයෙන් පදනම් වූයේ, දේශීය ප්‍රයෝජනය සඳහා නිෂ්පාදනය කිරීමය. මේ අනුව, දළ ජාතික නිෂ්පාදිතය, පවත්නා සාධක මිල අනුව සියයට 4·9 කින් ඉහළ යෑමක් දක්වූ අතර, ස්ථාවර මිල අනුව සියයට 4·2 කින් වැඩිවීමක් දැක්විය. පවත්නා මිල අනුව දළ දේශීය නිෂ්පාදිතය සියයට 5·2 ක් ඉහළින් පැවති අතර, ඉහත කී අනුපාත අතර ඇති වෙනස සිදුවූයේ, ඇයෝජන සම්බන්ධයෙන්වූ ශුද්ධ ගලා යෑම් ඉකුත් වර්ෂයට වඩා වැඩිවීම නිසාය.

ජන සංඛ්‍යාවේ වැඩිවීම 1967 දී සියයට 2·2 ක් වූ අතර, මෙය 1965 දී පැවති සියයට 2·4 සහ 1966දී පැවති සියයට 2·3 යන අනුපාතයන් ගෙන් දිස්වන අඩුවීගෙන යාමේ උපනතිය තව දුරටත් සිදුවීමකි. දළ ජාතික නිෂ්පාදිතය ඒකජන ආදායම අනුව බලන කළ 1967 දී පවත්නා මිල අනුව සියයට 2·7 කින් ද, ස්ථාවර මිල අනුව සියයට 2·0 කින් ද වැඩිවිය. වෙළඳ අනුපාතය තවදුරටත් පිරිහීමෙන් ඒකජන ජාතික ආදායම ඉහළ යෑම වැළකුණි.

1966 දී මෙන්ම 1967 දී ද ගෙවුම් ශේෂ තත්ත්වය බලවත් ලෙස උද්වේග දනවන සුළුවිය. 1966 දී සියයට 13·1 කින් පිරිහුණු වෙළඳ අනුපාතය තවදුරටත් සියයට 9·4 කින් පිරිහුනේ, අපනයන මිල සියයට 6·3 කින් පහල යාමත්, ආනයන මිල සියයට 3·4 කින් ඉහල යාමත් නිරූපනය කරමිනි. අපනයන ඉපැයුම් 1953 න් පසු පහළම මට්ටමට ඇද වැටුණු අතර, ආනයන ගෙවීම් 1966 දී පැමිණි ඉහලම මට්ටමට වඩා මදක් පහළින් පැවතියේය. මෙහි ප්‍රතිඵලය වර්ෂය මුළුල්ලේම විදේශීය ගෙවුම් සම්බන්ධයෙන් පීඩනයක් නොකඩවා පැවතීමයි.

1967 සඳහා වූ විදේශීය විනිමය අයවැය ලේඛනය යටතේ මුලින්ම සැකසූ ආනයන වැඩපිළිවෙල වන, රුපියල් දශ ලක්ෂ 2519 රුපියල් දශ ලක්ෂ 2231 ට පහල දමන්නට සිදුවූයේ පිරිහෙන ගෙවුම් ශේෂ තත්ත්වය නිසාය. නිත්‍ය වශයෙන් නිකුත් කරන ලද බල පත්‍ර අගය මෙයටත් වඩා රුපියල් දශලක්ෂ 176 කින් පහළ වැටිණි. වර්ෂය සඳහා වන ගෙවුම් ශේෂයේ වර්තන ගිණුමෙහි රුපියල් දශ ලක්ෂ 329 ක හිඟයක් පෙන්විය. වර්ෂ ගණනාවක් තිස්සේ නිරතුරුවම පාහේ පැවැති විදේශීය ගෙවුම් පීඩනයේ සමුච්චිත ප්‍රතිවිපාක හා ස්ටර්ලින් පවුම අව-ප්‍රමාණ කිරීම, ලංකාවේ රුපියල ද සියයට 20 කින් 1967 නොවැම්බර් 22 වෙනි දින දී අව ප්‍රමාණ කිරීමට හේතු විය.

ගෙවුම් ශේෂ තත්ත්වය පිරිහීමේ ප්‍රතිඵලයක් වශයෙන් විදේශීය බැංකු වත්කම් වල ශුද්ධ පිරිහීම, රජයේ මුදල් පරිහරණ කටයුතු වල වූ ප්‍රසාරණාත්මක මාර්ග වලින් පියවීම හා පුද්ගලික අංශයට වෙළඳ බැංකු ණය දීම් නිසා වුවමනාවටත් වඩා හිලව් වී ගියෙන්, 1966 දී සිදුවූ තරමක සංකෝචනයට ප්‍රති-විරුද්ධ ලෙස 1967 දී මූල්‍ය ප්‍රසාරණයක් ඇතිවිය. කෙසේ වුවත් මෙම ප්‍රසාරණය වර්ෂයේ අවසාන මාස හතරට සංකේන්ද්‍රණය වී පැවතියේය.

මුදල් සැපයුමෙහි 1967 දී දක්වුණු රුපියල් දශ ලක්ෂ 149 ක හෙවත් සියයට 9 ක ප්‍රසාරණය, අතිශයෝක්ති සිතුවමක් යැයි පෙනෙනුයේ, 1966 අවසාන මාස පහ තුල සිදු වූ මුදල් සැපයුමෙහි තියුණු සංකෝචනය සහ 1967 අවසාන මාස හතර තුල වූ තියුණු ප්‍රසාරණය අනුව බලන කලය. 1967 මුදල් සැපයුමෙහි මාසික සාමාන්‍ය මට්ටම ඉකුත් වර්ෂයේ දී පැවතියාට වඩා වැඩි වූයේ සියයට 2·7 කින් පමණි. ඒ අතර, 1966 වර්ෂයේ මුදල් සැපයුමේ මාසික සාමාන්‍ය මට්ටම 1965 දී පැවතියාට වඩා සියයට 2·2 කින් වැඩි විය.

දේශීය නිෂ්පාදනය වඩාත් දිරි ගැන්වීම් වස්, සමහර ආනයන සීමා කිරීම් සහ රුපියල අවප්‍රමාණ කිරීමෙන් මතුවන වියදම් ඉහළ යෑම් වලින් සමහරක් පාරිභෝගිකයින්ට පැවරීම යනාදී පරිපාලන විධිවිධාන ද සමග සිදු වූ මුදල් ප්‍රසාරණය ඉකුත් වර්ෂයේ පැවතියාට වඩා මිල පොදුවේ ඉහළ යෑමට හේතු වූ අතර, මෙය සිදු වූයේ දේශීය ප්‍රයෝජනය සඳහා භාණ්ඩ නිෂ්පාදනය ඉහල යෑමෙන් සෑහෙන තරමකින් වැඩි වූ සැපයුමක් ද තිබෙත්දීය. කොළඹ පාරිභෝජක මිල දර්ශකය අනුව මණින කල, මිල 1967 වර්ෂයේ දී සියයට 2·23 කින් ඉහළ ගියේය. පාරිභෝජනය හා ප්‍රාග්ධන සම්පාදනය යන දෙකම හා සම්බන්ධ සමාහාර වියදම දේශීය නිෂ්පාදනය මගින් ලබාදුන් සම්පත් ප්‍රමාණයට වඩා වැඩිය. මෙහි ප්‍රතිඵලය වූයේ ගෙවුම් ශේෂයේ සැලකිය යුතු තරම් විශාල හිඟයක් වීමය. එය භාණ්ඩ ආධාර, දීමනා ඇතුළු යෝජනා ක්‍රම ආධාර වැනි විදේශාධාර වලින් සහ විශේෂයෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, විදේශීය බැංකු මාගී සහ ගෙවීම් ගිවිසුම් වැනි කෙටිකාලීන වගකීම් වැඩිකර ගැනීම් මගින් පියවා ගන්නා ලදී.

## (1) 1967 ආර්ථික වර්ධනය

දළ ජාතික නිෂ්පාදනය පවත්නා සාධක මිල අනුව, 1967 දී සියයට 4·9 කින් ඉහල ගියේ යැයි තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. මෙය 1965 හා 1966 යන වර්ෂ වලදී පිළිවෙලින් සිදු වූ තරමක් පහළ වර්ධන අනුපාත වන සියයට 1·2 හා සියයට 2·9 ට වෙනස් තත්ත්වයකි. තාවකාලික සංඛ්‍යා තොරතුරු වලින් පෙනෙන පරිදි, දළ ජාතික නිෂ්පාදිතය පවත්නා සාධක මිල අනුව, 1966 දී පැවති රුපියල් දශ ලක්ෂ 7587 සිට රුපියල් දශ ලක්ෂ 7962 දක්වා 1967 දී ඉහළ ගියේය. මූර්ත වශයෙන් බලන කල (1959 ස්ථාවර මිල අනුව) දළ ජාතික නිෂ්පාදිතය සියයට 4·2 කින් 1967 දී ඉහළ ගියේ, 1966 වෙනුවෙන් සංශෝධිත තොරතුරු වලින් පෙන්වා දෙන පරිදි සියයට 2·3 කින් පමණක් ඉහළ යද්දීය. අපනයන මිල සියයට 6·3 කින් පහල යෑමෙන් හා ආනයන මිල සියයට 3·4 කින් ඉහළ යෑමෙන් උද්ගත වූ සියයට 9·4 ක අවාසි සහගත වූ වෙළඳ අනුපාතයේ හැඩගැස්ම සැලකිල්ලට ගත් විට, මූර්ත ජාතික ආදායම වැඩි වූයේ සියයට 2·2 කින් පමණි.

1967 මැදි වර්ෂ ජන සංඛ්‍යාව 11,741,000 යැයි ඇස්තමේන්තු කර ඇත. මෙය 1966 දී, පැවති ජන සංඛ්‍යාවට වඩා සියයට 2·2 කින් වැඩි අතර, මෑත වර්ෂ වලදී දක්නට ලැබුණු පිරිහෙන ජන සංඛ්‍යා වර්ධන උපනතියව තවදුරටත් පැවතීමක් නිරූපණය කරයි. ඒකජන වශයෙන් බලතොත්, දළ ජාතික නිෂ්පාදිතය, පවත්නා මිල අනුව සියයට 2·7 කින්ද, ස්ථාවර මිල අනුව සියයට 2 කින් ද 1967 දී වැඩි විය. මෙය 1966 දී පැවැති ඒකජන දළ ජාතික නිෂ්පාදිතය පවත්නා මිල අනුව සියයට 0·5 කින් ඉහළ යාම හා ස්ථාවර මිල අනුව කිසිවක් වැඩි නොවීමට වෙනස් තත්ත්වයකි. කෙසේ වෙතත්, වෙළඳ අනුපාතයේ පිරිහීම අනුව බලන කල, දළ ජාතික ආදායමේ වැඩිවීම, ජන සංඛ්‍යාවේ වර්ධනයට හුදෙක් සමවනු පමණක් හෙයින්, ඒකජන මූර්ත ජාතික ආදායම 1966 හා 1967 යන වර්ෂ දෙක අතරේ දී ස්ථාවරව පැවතින.

පවත්නා මිල අනුව දළ ජාතික නිෂ්පාදිතයේ සියයට 4·9 ක වැඩිවීමක් ලබාගන්නා ලද්දේ, විදේශීය අංශයේ හැඩගැස්මෙහි පැවති පිරිහීම වුවමනාවටත් වඩා මකාලීමට සමත් වූ දේශීය අංශයේ දියුණු හැඩගැස්ම නිසාමය. දේශීය කෘෂිකර්මය, බැංකු හා රක්ෂණ කටයුතු, තැනීම් හා නිපදවීම් වල සැහෙන පුළුල්වීමක් සිදු විය. 1967 දී තේ, රබර් හා පොල් වල ශුද්ධ නිමැවුම සියයට 2·9 කින් පහළ වැටින. මෙයට වෙනස් ලෙස දේශීය කෘෂිකර්මය පුළුල්වීම පවත්නා මිල අනුව සියයට 19·2 කින් සිදු විය. මෙම කොටස ඇතුළත, වී වල ශුද්ධ නිමැවුම සියයට 49·9 කින් ද, කිරි හා බිත්තර වලදී සියයට 4·5 කින් ද, අමතර ආහාර බෝග වලදී සියයට 5·3 කින් ද වැඩි වීය.

විදේශීය අංශයේ පිරිහීම තවදුරටත් සිදු වූවත්, සථාවර මිල අනුව දළ ජාතික නිෂ්පාදිතය සියයට 4·2 කින් 1967 දී ඉහළ ගියේ, දේශීය අංශයේ හැඩගැස්මෙහි පැවති සැහෙන ප්‍රමාණයක වූ දියුණුව හේතුකොට ගෙනය. අපනයන අංශයේ තේ හා පොල් නිමැයුම පහල වැටුනත්, රබර් නිමැයුම ඉහළ ගියේය. මෙයට ප්‍රතිවිරුද්ධ ලෙස දේශීය කෘෂිකර්ම අංශයේ දී, වී, පශුධන, මාළු හා අනෙකුත් ආහාර බෝග වල නිමැයුමෙහි මූර්ත අගය පැහැදිලි වැඩිවීමක් පෙන්විය. විශේෂයෙන්ම වී නිෂ්පාදනය සියයට 20·3 කින් ඉහල යාම දිරි ගන්වන සුළුය. කාර්මික අංශය එකතු කළ අගය සියයට 6·3 කින් ඉහළ යැමක් සටහන් කළ අතර, තැනීම් කටයුතු වල මූර්ත අගය සියයට 16·8 කින් වැඩි වූයේ යැයි ඇස්තමේන්තු කර ඇත. බැංකු හා රක්ෂණ කටයුතු වල මූර්ත අගය සියයට 18·7 කින් වැඩි වූයේ යැයි ගණන් බලා ඇති අතර, පරිවහනය, අනෙක් සම්බන්ධතා හා බඩු ගබඩා කිරීම් සියයට 2·4 ක ඉහළ යැමක් සටහන් කරයි. කෘෂිකර්ම අංශයේ දී තේ නිෂ්පාදනය 1966 දී පැවැති රාත්තල් දශ ලක්ෂ 490 සිට රාත්තල් දශ ලක්ෂ 487 දක්වා 1967 දී අඩු විය. මෙය රාත්තල් දශ ලක්ෂ 3 ක පහල යාමකි. තේ වගාව යටතේ ඇතැයි වාර්තා ගත වී ඇති, අක්කර ප්‍රමාණයේ සුළු ඉහල යැමක් පැවතියත්, අක්කරයක සාමාන්‍ය ඵලදාව 1966 දී පැවැති රාත්තල් 823 සිට රාත්තල් 816 දක්වා 1967 දී පහළ යාමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙය සිදු විය. අනෙක් අතට රබර් නිෂ්පාදනය රාත්තල් දශ ලක්ෂ 27 කින් වැඩි වී රාත්තල් දශ ලක්ෂ 316 ක් විය. නිෂ්පාදනය යටතේ ඇති අක්කර ප්‍රමාණය වැඩිවීම හා අක්කරයක ඵලදාව 1966 පැවැති රාත්තල් 609 සිට රාත්තල් 647 දක්වා වැඩිවීම මෙයට හේතු විය. පොල් නිෂ්පාදනය සියයට 1·9 කින් පහල ගියේ යැයි ඇස්තමේන්තු කර ඇති අතර, මෙය ප්‍රධාන වශයෙන්ම පසුගිය වර්ෂ දෙකේ දී හා 1967 දී පැවති අසතුටුදායක කාලගුණ තත්ත්වයේ ප්‍රතිඵලයකි. මෙයට වෙනස් ලෙස, විවෘත වෙළඳ පොළේ පැවති ඉහල මිල, පුළුල් කිරීමේ සේවා කාර්යක්ෂම කිරීම හා සතුටුදායක කාලගුණ තත්ත්වයෙන් අනුබල ලද වී නිෂ්පාදනය මෙතෙක් වාර්තා ගත වූ ඉහළම මට්ටම වන බුසල් දශ ලක්ෂ 55·1, ඉකුත් වර්ෂයේ නිෂ්පාදනය වන බුසල් දශලක්ෂ 45·7 ට වඩා සියයට 20·6 ක ඉහල යැමක් පෙන්නුම් කරයි.

වෙළඳ මිල අනුව දළ ජාතික වියදම වන රුපියල් දශ ලක්ෂ 8921, 1967 දී, සියයට 7·9 ක වැඩිවීමක් පෙන්නුම් කළේය. මෙය ඉකුත් වර්ෂයේ වැඩිවීම වන සියයට 5·6 හා සැසැඳේ. පෞද්ගලික පරිභෝජන වියදම් සියයට 6·6 කින්ද, පොදු පාරිභෝජනය සියයට 6·0 කින්ද, දළ දේශීය ප්‍රාග්ධන සම්පාදනය සියයට 16·9 කින්ද ඉහලයාමෙන් මෙය සැකැසින. 1967 දී දළ සථාවර ප්‍රාග්ධන සම්පාදනය සියයට 12·2 කින් වැඩිවූයේ රාජ්‍ය සංසථා ඇතුළු පෞද්ගලික අංශයේ වැඩිවීම වන සියයට 11·4 ද, රාජ්‍ය අංශයේ වැඩිවීම වන සියයට 13·7 ද නිසාය. මෙය ඉකුත් වර්ෂයේ දී පෞද්ගලික හා රාජ්‍ය සංසථාවල වැඩිවීමේ වේගයන් වන සියයට 12·3 න් හා රාජ්‍ය අංශයේ සියයට 2·4 න් සැකැසුනු සියයට 8·6 ක දළ සථාවර

ප්‍රග්ධන සම්පාදන වැඩිවීම් වේගය හා සැසැඳෙයි. ආනයන වැඩ පිළිවෙල, ප්‍රාග්ධන හා අන්තර්භාණ්ඩ වලට වැඩි වන ලෙස හැඩගැස්වීමෙන් හා දේශීය මෙන්ම ආනයනය කළ අමු ද්‍රව්‍ය යොදාගනිමින්, ප්‍රාග්ධන භාණ්ඩ හා ගොඩනැගිලි තැනීමේ උපකරණ දේශීය වශයෙන් නිෂ්පාදනය ඉහළ නැංවීම හේතුකොට ගෙන, මෙම සතුටුදායක ප්‍රතිඵලය ලැබුණු බව නිසැකය. මේ සම්බන්ධයෙන් විශේෂයෙන්ම සඳහන් කළ යුතු දෙයක් නම්, 1966 පැවති සිමෙන්ති ටොන් 81,000 සිට ටොන් 189,000 තෙක් සිමෙන්ති නිශ්පාදනය 1967 දී ඉහල යාමයි. එමගින් නිමැයුම දෙගුණයකටත් වැඩිවිය.

පරිභෝජනය හා ප්‍රාග්ධන සම්පාදනය අනුව බලන කල, මුළු ඉල්ලුම, දේශීය නිෂ්පාදනයෙන් ලබා දුන් සම්පත් ප්‍රමාණය ඉක්ම වූ අතර, ගෙවුම් ශේෂයේ සැහෙන තරම් විශාල හිඟයට හේතු වූ බව අන් තැනකදී ද සාකච්ඡා කරන ලදී. එම හිඟය පියවා ගන්නා ලද්දේ ජාත්‍යන්තර ණය ගැතිකම වැඩිකර ගැනීමෙන් හා ජාත්‍යන්තර දීමනා හා මාරු කිරීම්වල ආධාරයෙනි.

සංක්ෂිප්ත වශයෙන් බලතොත්, 1967 දී ආර්ථිකයේ හැඩගැස්ම ඉකුත් වර්ෂ දෙකේ හැඩගැස්ම හා සසඳන කල සැහෙන දියුණුවක් පෙන්විය. දළ ජාතික නිෂ්පාදිතය මූර්ත වශයෙන් බලන කල, ජන සංඛ්‍යාවේ වැඩිවීම සඳහා වුවමනා ප්‍රමාණයටත් වඩා වැඩි වූ හෙයින්, ඒකජන මූර්ත නිෂ්පාදිතයේ සියයට 2 ක ඉහල යැමකට ඉඩ ලැබුණි. කෙසේ වෙතත් වෙළඳ අනුපාතය තවදුරටත් පිරිහීමෙන්, ඒකජන මූර්ත ජාතික ආදායම ඉහලයැම වැළකුනි.

1966-67[1] සංවර්ධන වැඩ පිළිවෙලෙහි 1965 සිට 1967 දක්වා කාලපේදය සඳහා වන සාමාන්‍ය වාර්ෂික ඉලක්කවලට වඩා අංශ කිහිපයකදීම සාමාන්‍ය නිමැවුම ඉහල යැම දිරි ගන්වන සුළු කරුණක් වේ. දේශීය ප්‍රයෝජනයට ගැනීම සඳහා වන කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදන අංශවල ඉ ක්කයන් ඉක්මවා තිබුණි. ආනයනය කිරීම සඳහා වන කෘෂිකාර්මික හා කාර්මික නිෂ්පාදනයන්හි පිරිහීමක් නොවුයේ නම්, 1965-1971 වර්ෂයන් සඳහා බලාපොරොත්තු වූ වාර්ෂික සාමාන්‍ය ඉලක්ක දළ ජාතික නිෂ්පාදිතයේ දී ද ඉක්මවීමට ඉඩ තිබුණි. දේශීය නිෂ්පාදනයේ දී ලබා ගෙන ඇති වර්ධන ප්‍රවර්තක ශක්තිය අනාගතය සම්බන්ධයෙන් හොඳ පෙර නිමිති පල කරයි.

## (2) 1967 දී රාජ්‍ය මුදල් පරිහරණයේ හා මුදල් කටයුතු වල හැඩගැස්ම.

තරමක මූල්‍ය ප්‍රසාරණයක් 1967 දී පැවතියත් ඉහත ජේදයේදී පෙන්වා දුන්නා සේ ආනයනය කොට සැපයූ භාණ්ඩ ඉකුත් වර්ෂයේ පැවතියාට වඩා අඩුවුනත් සැපයුම් තත්ත්වයද 1966 දී පැවතියාට වඩා සතුටුදායක විය.

එහෙත් මිල මට්ටම 1966 දී පැවතියාට වඩා පොදුවේ බලන කල ඉහලින් විය. අනතුරු ඡෙදවලදී රාජ්‍ය මූල්‍ය හා අනෙක් මූල්‍ය අංශයන්හි හැඩගැස්ම විශ්ලේෂණයට ලක් කරනු ලැබේ.

---

1 ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය, සංවර්ධන වැඩ පිළිවෙල 1966 ජූලි.

## (අ) රජයේ අයවැය ලේඛනය 1966/67

1966/67 වර්ෂයේදී රාජ්‍ය මූල්‍ය කටයුතු වලින් ඇතිවන ශුද්ධ ප්‍රසාරණාත්මක බලපෑම රුපියල් දශ ලක්ෂ 55 කි. ඉකුත් මුදල් වර්ෂයේ දී මෙය රුපියල් දශ ලක්ෂ 122 වූ අතර 1964/65 වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 35 ක් විය.[1]

අයවැය ලේඛනයේ දක්වුනු අයභාර ඉලක්ක ලබාගත නොහැකි වූවත් අයභාර එකතු වීම, ඉකුත් මුදල් වර්ෂයේදීට වඩා රුපියල් දශ ලක්ෂ 121 කින් වැඩි විය ලබාගත හැකි තාවකාලික තොරතුරු අනුව 1966/67 වර්ෂයේදී නියම අයභාර එකතුවීම් රුපියල් දශ ලක්ෂ 1955 කි. 1966/67 සඳහා මුල් ඇස්තමේන්තුව රුපියල් දශ ලක්ෂ 2033 ක් වූ අතර 1965/66 වර්ෂයේදී සැබෑ එකතුවීම් රුපියල් දශ ලක්ෂ 1833 කි. අයභාරයෙහි සියයට 6·6 ක ඉහළ යෑමක් ඇතිවීම, ඉකුත් මුදල් වර්ෂයට වඩා පැහැදිලි දියුණුවකි. එසේ ම, පසුගිය මුදල් වර්ෂ 5 තුළ දී සඳහන් වූ වාර්ෂික අයභාර වල වේගය වන සියයට 4 ට වඩා එම ප්‍රමාණය වැඩි වූයේය. ඉකුත් මුදල් වර්ෂය හා සසඳ බලන කල මේ මුදල් වර්ෂයේ දී අයභාරයේ ඉහළ යාම, ආනයන ගාස්තු, දේශීය භාණ්ඩ බදු සහ ආදායම් බදු ඉහළ යාම නිසා සිදුවිය. අපනයන බදු අයභාරය අඩුවීමෙන් මෙය තරමක් දුරට මැකී ගියේය.

1966/67 වර්ෂයේ දී මුළු වැය සම්මතය වන රුපියල් දශ ලක්ෂ 2,520, වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ වියදමට වඩා රුපියල් දශ ලක්ෂ 15 කින් අඩු ය. වියදම මෙසේ අඩුවූයේ ප්‍රාග්ධන හා වර්තන වැය සම්මතයන්හි ඌනන වියදම් හේතු කොට ගෙනය කෙසේ වෙතත්, ඉකුත් මුදල් වර්ෂය හා සංසන්දනය කරන කල, 1966/67 මුළු සම්මත වැය, ඉකුත් වර්ෂයේ නියම වැයට වඩා රුපියල් දශ ලක්ෂ 131 කින් හෙවත් සියයට 6 කින් වැඩිය.

1966/67 රජයේ ප්‍රාග්ධන වියදම් (ආවර්තන වැය වල ඇති ප්‍රාග්ධන ශීර්ෂ හා අයවැය ලේඛනයෙන් බාහිර මුදල් කිරීම් ඇතුළුව රුපියල් දශ ලක්ෂ 702 කි. මෙය ඉකුත් මුදල් වර්ෂයේ ප්‍රමාණයට වඩා රුපියල් දශ ලක්ෂ 105 කින් වැඩිය. මෙය කවර මුදල් වර්ෂයක් හෝ වෙනුවෙන්, ලබා ගෙන ඇති ඉහළ ම ප්‍රාග්ධන වියදම් මට්ටමයි.

---

1 බැංකු ක්‍රමය විසින් දරන රජයේ ආනයන (ආහාර) බිල්පත්‍ර අගය මෙම සංඛ්‍යාවලට අයත් නැත. මුදල් සැපයුම පිළිබඳ විශ්ලේෂනයේදී මෙම ආනයන බිල් පත්‍ර මගින් බැංකු ක්‍රමයෙන් රජයට දුන් ණයෙහි කොටසක් වශයෙන් සඳහන් විය. එසේ වෙතත් ගෙවීම් හා ලැබීම් පදනම කොට සැකසුන රජයේ ගිණුම්වල මෙසේ නොබේරා ඇති ආනයන බිල්පත්‍ර රජයේ වියදම්වල කොටසක් වශයෙන් සඳහන් නොවේ. එයතින් බැංකු ක්‍රමයේ හිඟය පියවීමට ගත් මුදල් වලින් කොටසක් ද ඉවත්කොට ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් බැංකු ණය කෙරෙහි රජය මෙසේ විශේෂ ස්වරූපයෙන් කටයුතු කිරීම, මේ අන්දමේ ණය ඉහල ගිය වර්ෂවලදී ප්‍රසාරණාත්මක බලපෑම් සහ මුළු හිඟය අඩුවෙන් සටහන් වීමටත් මෙම ණය පහල ගිය වර්ෂවලදී ඒවා වැඩියෙන් සටහන් වීමටත් හේතුවිය. බැංකු නොවන ආයතන වලින් කළ ණය ගැනීම් වලටත් 1966 – 67 දී සිදුවූ ප්‍රසාරණාත්මක බලපෑමටත්, තව දුරටත් බල පෑ සාධකයක් නම් මහ බැංකුව රුපියල් දශ ලක්ෂ 53·4 සුරැකුම්පත් නිදහස් කිරීමය. මේවා ඉතිරි කිරීමේ ආයතන අංශය විසින් දරන ලදී. මෙම සුරැකුම්පත් මහ බැංකුව විසින් නිදහස් කිරීමත් සමගම ඉතිරි කිරීමේ ආයතන රජයේ සුරැකුම් පත් වලට කරන පරිත්‍යාගය වැඩි කරන ලදී. මෙය, බැංකු නොවන මාර්ග වලින් ණය ගැනුම යටතේ සඳහන් වූවත්, ඇත්ත වශයෙන්ම කිවහොත් මහ බැංකුව අතිරේක අරමුදල් සපයා ඇත. මේ සාධක සඳහා ගැලපිලි කළ විට සංඛ්‍යා සටහනෙහි 1 (ආ), 2, 4, 6 යන පේලි පහත සඳහන් ලෙස වේ.

රුපියල් දශ ලක්ෂ

| | | 1962/63 | 19 6364 | 1964/65 | 1965/66 | 1966/67 (තාව කාලික) |
|---|---|---|---|---|---|---|
| 1. | (ආ) දේශීය වෙළඳ පොළෙන් ණය ගැනීම, දේශීය බැංකු නොවන මාර්ග වලින් .. | 155.0 | 207.6 | 243.2 | 255.9 | 243.6 |
| 2. | බැංකු ක්‍රමයෙන් කළ දේශීය ණය ගැනීම් .. | 178.1 | 115.2 | 71.0 | 185.0 | 151.0 |
| 4. | ශුද්ධ මුළු මුදල් හිඟය .. | 391.7 | 461.7 | 483.7 | 588.7 | 652.3 |
| 6. | රජයේ මූල්‍ය කටයුතුවල ශුද්ධ ප්‍රසාරණාත්මක බලපෑම් .. | 162.0 | 162.9 | 88.0 | 145.1 | 154.9 |

කෙසේ වෙතත්, මෙම මුළු ගණනට රුපියල් දශ ලක්ෂ 222 ක රාජ්‍ය සංස්ථාවලට කළ දීමනා ඇතුළත්ය. මෙයට ගැලපිලි කිරීමෙන් පසුව ද, මධ්‍යම ආණ්ඩුවේ මුළු ස්ථාවර ප්‍රාග්ධන සම්පාදනය වන රුපියල් දශ ලක්ෂ 422, කවර මුදල් වර්ෂයක් වෙනුවෙන් වුවද ලබා ගෙන ඇති ඉහළම මට්ටම වෙයි. එසේම ඉකුත් වර්ෂයේ අනුරූප සංඛ්‍යාවට වඩා රුපියල් දශ ලක්ෂ 40 කින් වැඩිය මෙම සතුටුදායක ප්‍රතිඵලය ප්‍රධාන වශයෙන් ලබා ගන්නා ලද්දේ, ප්‍රාග්ධන යෝජනා ක්‍රම වඩාත් කාර්යක්ෂම ලෙස රජයේ දෙපාර්තමේන්තු මගින් ක්‍රියාත්මක කිරීම හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ වගකීම දරණ නිලධාරීන් වර්ධනය සම්බන්ධ තියුණු පරීක්ෂාවකින් සිටීම නිසා බවට සැකයක් නැත. එසේ වෙතත්, ප්‍රාග්ධන වැයෙහි සැබෑ වියදම ඇස්තමේන්තු කළ ප්‍රමාණයෙන් රුපියල් දශ ලක්ෂ 137 ක්. තරම් විශාල ප්‍රමාණයකින් හෙවත් සියයට 18 ක් අඩුවෙන් සිදුවිය. පසුගිය වාර්ෂික වාර්තාවෙන් ප්‍රාග්ධන වැයෙහි දක්නට ලැබුණු දියුණුව සම්බන්ධයෙන් සැලකිල්ල යොමු කරවන ලදී. එසේ වුවද, 1966/67 දී ඌන වියදම් අනුපාතය නැවතත් ඉහළ ගොස් ඇත. ප්‍රාග්ධන වියදමේ මෙම හැඩ ගැස්මට විදේශීය විනිමය දුෂ්කරතා තරමක් දුරට බලපාන්නට ඇතත්, මෙම ඌන වියදම් අනුපාතය ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තු වඩාත් පරීක්ෂාකාරීව සකස් කිරීමටත් ප්‍රාග්ධන වියදම්හි සැබෑ ක්‍රියාත්මක වීම ගැන වඩාත් උනන්දු වීමටත් ඇති අවශ්‍යතාවය පැහැදිලිව පෙන්නුම් කර දෙයි.

1966/67 වර්ෂයෙහි රජයේ වර්තන වියදම් රුපියල් දශලක්ෂ 6819 ක් වන අතර, මෙය ඇස්තමේන්තුවලට වඩා රුපියල් දශ ලක්ෂ 73 කින් අඩුය. ඇස්තමේන්තුව හා සසඳා බලන කළ නියම වියදම අඩුවීමට ප්‍රධාන වශයෙන් හේතුවී, ඇත්තේ, (ශුද්ධ) ආහාර පිහිටාධාර වියදම්වල පැහැදිලි අඩුවීමයි. ඇස්තමේන්තු කර තිබුණු වියදම වන රුපියල් දශලක්ෂ 307 සිට සැබෑ වියදම වන රුපියල් දශලක්ෂ 193 දක්වා ඇද වැටුනේ, 1966 දෙසැම්බර් 18 වෙනි දින පිහිටාධාර ලබන සහල් සේරු දෙකක සලාකය වෙනුවට, හාල් සේරුවක් නොමිලේ දීමට රජය ගත් තීරණයත්, එයින් අනතුරුව ධාන්‍ය පාරිභෝජන රටාවේ ඇතිවූ වෙනස්වීම් වලත් ප්‍රතිඵලයක් වශයෙනි. ශුද්ධ ආහාර පිහිටාධාර වියදම ඉකුත් වර්ෂයේදී පැවතියාට වඩා රුපියල් දශලක්ෂ 81 කින් අඩුය. මෙසේ පැවතියත් 1966 හා 1967 වර්ෂයේ වර්තන වියදම් 1965/66 වර්ෂයේ වියදම් වලට වඩා රුපියල් දශ ලක්ෂ 27 කින් ඉහළ ගියේ, පරිපාලනය, සමාජ සේවය, ආර්ථික සේවා, රජයේ ව්‍යාපාර රාජ්‍ය ණය පොලී හා විශ්‍රාම වැටුප් ඉහල යෑමේ ප්‍රතිඵලයක් වශයෙනි. එසේ වෙතුදු 1966/67 වර්ෂයේ රාජ්‍ය මුදල්කටයුතු පරිහරණයේ ඉතා වැදගත් ලක්ෂණයක් වනුයේ වාර්ෂික ආහාර පිහිටාධාර වියදම් සැහෙන තරමකින් අඩුකර ගැනීමයි.

1966/67 මුදල් වර්ෂයේදී අය වැය ලේඛනයේ සමස්ත හිඟය රුපියල් දශ ලක්ෂ 682 කි. ශුද්ධ මුදල් හිඟය (නිදන් අරමුදලේ දායක දීමනා ජාත්‍යන්තර සංවිධාන වලට විශේෂ ගෙවීම් සහ අත්තිකාරම් ගිණුමේ කටයුතු වලට ගැලපීමෙන් පසු) රුපියල් දශ ලක්ෂ 606 ක් විය. ඉකුත් වර්ෂයේදී මෙය රුපියල් දශලක්ෂ 566 කි. රුපියල් දශ ලක්ෂ 40 කින් මෙසේ ශුද්ධ මුදල් හිඟය වැඩිවීම ප්‍රාග්ධන හා ආවර්තන වියදම් වැඩිවීම හා එය තරමක් දුරට මකාලූ ආදායම වැඩිවීමේ ඒකාබද්ධ ප්‍රතිඵලයකි. සංඛ්‍යා සටහන 1-1 දක්වා ඇති පරිදි ශුද්ධ මුදල් හිඟය පියවීමේදී රජය රුපියල් දශ ලක්ෂ 51 කින් පමණි, බැංකු ක්‍රමයෙන් පිහිට ලබාගෙන ඇත්තේ. මෙයට වෙනස් ලෙස ඉකුත් වර්ෂයේදී බැංකු ක්‍රමයෙන් රුපියල් දශ ලක්ෂ 162 ක ණය ලබාගෙන ඇත. විදේශීය මුදල් ඇතුළු බැංකු නොවන මාර්ගවලින්, හිඟය පියවීම රුපියල් දශ ලක්ෂ 486 සිට රුපියල් දශ ලක්ෂ 578 දක්වා ඉහල ගිය අතර භාණ්ඩාගාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් ඇතුළු මුදල් ශේෂ රුපියල් දශ ලක්ෂ 23 කින් ඉහළ

ගියේය. එක්සත් ජනපදයට බැර කොට මහ බැංකුව වෙතැති (එක්සත් ජනපද ආධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් රුපියල් දශ ලක්ෂ 27 කින් පහල ගියේය. මෙම මූල්‍ය කටයුතුවල ඒකාබද්ධ ප්‍රතිඵලය වූයේ ශුද්ධ ප්‍රසාරණාත්මක පරතරය රුපියල් දශ ලක්ෂ 55 වීමය. මෙය ඉකුත් වර්ෂයේ පැවති රුපියල් දශ ලක්ෂ 122 ට වඩා සෑහෙන තරමකින් අඩුය.

1966/67 මුදල් වර්ෂයේ ශුද්ධ මුදල් හිඟය ඉකුත් වර්ෂයේ පැවතියාට වඩා රුපියල් දශලක්ෂ 40 කින් වැඩිය.. එහෙත් රාජ්‍ය මූල්‍ය කටයුතුවල ප්‍රසාරණාත්මක බලපෑම රුපියල් දශලක්ෂ 67 කින් අඩුය. මෙම මුදුන් පමුණුවා ගැනීම ප්‍රධාන වශයෙන් ඉකුත් වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 35 ක්වූ භාණ්ඩ ණය 1966/67 දී රුපියල් දශ ලක්ෂ 192 දක්වා වැඩිවීමේ ප්‍රතිඵලයක් විය[1]. බැංකු නොවන දේශීය වෙළඳ මූල යන්ගෙන් ලබාගත් ණය රුපියල් දශ ලක්ෂ 41 කින් වැඩිවුණු අතර මෙම වැඩිවීම් මුදුන් පමුණුවා ගැනීමට හැකි වූයේ ඉතිරි කිරීමේ ආයතන විසින් දරණ ලද

## 1 – 1 සංඛ්‍යා සටහන

## 1962/63 සිට 1966/67 දක්වා හිඟය පියවීම

රුපියල් දශ ලක්ෂ

| පියවූ මාර්ග | 1962/63 | 1963/64 | 1964/65 | 1965/66 | 1966/67 (තාව කාලික) |
|---|---|---|---|---|---|
| 1. බැංකු නොවන මාර්ග වලින් (මුළු) .. | 213·2 | 301·1 | 393·2 | 486·1 | 577.8 |
| එයින් | | | | | |
| (අ) දේශීය බැංකු නොවන මාර්ග .. | – 33·8 | – 1·9 | 50·3 | 112·1 | 72.2 |
| (ආ) බැංකු නොවන දේශීය වෙළඳපොල මාර්ග වලින් ණය ගැනීම .. .. | 153·5 | 207·6 | 243·2 | 255·9 | 297·0 |
| (ඇ) විදේශීය ණය හා දීමනා .. .. | 93·8 | 95·4 | 99·7 | 118·0 | 208·6 |
| 2. බැංකු ක්‍රමයෙන් ලබාගත් දේශීය ණය .. | 178·1 | 115·2 | 17·7 | 162·3 | 51.3 |
| 3. රජයේ මුදල් ශේෂ හා භාණ්ඩාධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් | | | | | |
| (අ) මුදල් ශේෂ .. .. | 0·4 | 45·4 | 19·5 | – 47·2 | 20·0 |
| (ආ) භාණ්ඩාධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදල් .. | — | — | – | – 35·2 | – 43·9 |
| 4. මුළු ශුද්ධ හිඟය .. .. | 391·7 | 461·7 | 430·4 | 565·9 | 606·0 |
| 5. එ. ජ. ආධාර ප්‍රතිපාර්ශ්වීය අරමුදලට ගැලපිලි .. | – 16·5 | 2·3 | – 2·5 | 42·5 | 27·2 |
| 6. රාජ්‍ය මුදල් පරිහරණයේ ශුද්ධ ප්‍රසාරණාත්මක බලපෑම (2+3+5) .. | 162·0 | 162·9 | 34·7 | 122·4 | 55·2 |

රුපියල් දශ ලක්ෂ 41 ක් වටිනා මහ බැංකු සුරැකුම්පත් මහ බැංකුව විසින් නිදහස් කර ගත් හෙයින් හා එම ආයතන මගින් එම මුදල් රජයේ සුරැකුම්පත් ලබා ගැණීමට යෙදවූ හෙයිනි. වැදගත් කරුණක් වනුයේ මෙම අති විශේෂ සිද්ධිය නොවූයේ නම් බැංකු නොවන දේශීය වෙළඳ මූලයන්ගෙන් ලබා ගන්නා ණය ඇත්ත වශයෙන්ම පිරිහෙන්ට ඉඩ තිබීමය. ඉතිරි කිරීමේ ආයත්නයන්ගේ යෙදවීම් මුළුමනින් ම පිරිහීමට ඉඩ තිබුණෙන් එම ආයතනවල තැන්පතු ඉහළ නැංවීමටත් ආපසු ගැනීම් අධෛර්යයී කිරීමටත් ගන්නා ක්‍රියා මාර්ගයන්හි වැදගත්කම කිව නොහැකි තරම්ය. ඉතිරි කිරීමේ ආයතන විසින් සපයනු ලබන

1. භාණ්ඩ ණය මුදල් ගනු ලබන්නේ රජය මගිනි; ඒවා ප්‍රයෝජනයට ගැනීමෙන්, මහ බැංකුව වෙතැති විශේෂ ප්‍රතිපාර්ශ්වීය අරමුදලේ රජයේ මුදල් ශේෂයන් වැඩිවේ. අය වැය හේතූන් සඳහා රජය විසින් වරින් වර මෙම මුදල් ශේෂයන්ගෙන් හැරගනී.

පහසුකම් වැඩි කිරීමෙත් මුදල් නැන්පත් කරන්නන් හට ගෙවනු ලබන පොලී අනුපාතිකය වැඩි කිරීමෙත් අවශ්‍යතාවය මුදල් මණ්ඩලය විසින් මේ සම්බන්ධ යෙන් රජය වෙත යෝජනා කොට ඇත. අය වැය ලේඛනය ඉදිරිපත් කරන අවස්ථාවේ විදේශීය යෝජනා ක්‍රම ණය වශයෙන් රුපියල් දශ ලක්ෂ 83 ක් ලැබේ යැයි බලාපොරොත්තු වුවද ඇත්ත වශයෙන් ලැබී ඇත්තේ, රුපියල් දශ ලක්ෂ 17 ක් පමණක් වීම අධෛර්‍යමත් කරන සුළු ලක්ෂණයක් විය. යෝජනා ක්‍රම ණය සහ දීමනාවල මෙම පහල වැටීම නොවූයේ නම්, ප්‍රසාරණ පරතරයක් ඇති නොවන්ට ඉඩ තිබිනි.

1967 සැප්තැම්බර් මාසයේදී පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 1967/68 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු වලින් රුපියල් දශ ලක්ෂ 768 ක අය වැය හිගයක් බලාපොරොත්තු වූ අතර, එය බැංකු නොවන දේශීය වෙළඳ පොල මගින් රුපියල් දශ ලක්ෂ 350 ක ණය මුදලකින්ද, භාණ්ඩාගාර ප්‍රති පාර්ශ්වීය අරමුදල් වලින් රුපියල් දශ ලක්ෂ 150 ක් ප්‍රයෝජනයට ගැනීමෙන්ද, රුපියල් දශ ලක්ෂ 125 ක විදේශීය යෝජනාක්‍රම ආධාර වලින් ද, රුපියල් දශ ලක්ෂ 25 ක පරිපාලන ණය ගැනුම් වලින් ද, රජයේ සංයුක්ත මණ්ඩල සහ ව්‍යාපාරවල ලාභ සහ සංචිත රුපියල් දශ ලක්ෂ 22 කින් ද ප්‍රයෝජන ගැනීමෙන් පසු ප්‍රසාරණාත්මක මූලයන්ගෙන් පියවීමට රුපියල් දශ ලක්ෂ 96 ක් ඉතිරි වේ.

1967 නොවැම්බර් මස 22 දින සියයට 20 කින් රුපියල අවප්‍රමාණ කිරීම හා ඒ සමගම ගත් අනෙක් ක්‍රියාමාර්ග අයවැය කෙරෙහි බල පෑ ආකාරය ගණන් ගැනීම සඳහා, මෙම ඇස්තමේන්තු සැලකිය යුතු අන්දමින් වෙනස් කිරීමට දැන් සිදුවී ඇත. තවද, ලෝක වෙළඳ පොලෙහි සහල් වල මිලෙහි සීඝ්‍ර වැඩිවීමක් ඇති- වූයෙන්, ඇස්තමේන්තු සඳහා ගෙන ඇති ටොන් එකකට ස්ටර්ලින් පවුම් 48 මිළ කිසිසේත් යථාර්ථ නිරූපී. නොවේ. ඉහතින් පාද සටහනෙක සඳහන් කරන ලද බැංකු ක්‍රමය මගින් රුපියල් දශ ලක්ෂ 122 ක ආනයන බිල්පත් පවත්නා මුදල් වර්ෂය තුළදී මුලුමනින් බේරාලිය හැකිය. මෙම කරුණු කිහිපය හේතු කොට ගෙන, 1967/68 අය වැය හිඟය මෙන් ප්‍රසාරණ පරතරයද 1967 සැප්තැම්බර් මාසයේ දී සම්මත වුණු අය වැය ලේඛනයේ ඇස්තමේන්තු වලින් බලාපොරොත්තු වූවාට වඩා වැඩි විය හැක.

**(ආ) පෞද්ගලික අංශයට දී ඇති වෙළඳ බැංකු ණය.**

පෞද්ගලික අංශය විසින් 1966 දීට වඩා 1967 දී බැංකු ක්‍රමයේ පිළිසරණ ලබා ගන්නා ලදී. එහෙයින්, පෞද්ගලික අංශයට දී ඇති දළ වෙළඳ බැංකු ණය 1966 දී රුපියල් දශ ලක්ෂ 92 සිට 1967 දී රුපියල් දශ ලක්ෂ 105 දක්වා වැඩිවිණි. 1–2 සංඛ්‍යා සටහන පෞද්ගලික අංශය වෙත දී ඇති වෙළඳ බැංකු අත්තිකාරම් සම්පිණ්ඩනය කොට දක්වයි.

**1–2 සංඛ්‍යා සටහන**

**පෞද්ගලික අංශයට දෙන ලද වෙළෙඳ බැංකු අත්තිකාරම්**

රුපියල් දශ ලක්ෂ

| | දෙසැම්බර් අවසානය | | | 1966/67 වෙනස |
|---|---|---|---|---|
| | 1965 | 1966 | 1967 | |
| (අ) එකතු කෙරිගෙන යන මුදල් ශීර්ෂI* .. | 71·1 | 107·1 | 56·9 | − 50·2 |
| (ආ) දේශීය බිල් .. .. .. | ... | — | — | — |
| (ඇ) ආයතන බිල් .. .. | 49·7 | 35·3 | 55·6 | + 20·3 |
| (ඈ) අපනයන බිල් .. .. | 47·1 | 52·4 | 53·4 | + 1·0 |
| (ඉ) අයිරාවන් .. .. .. | 383·0 | 391·9 | 418·9 | + 27·0 |
| (ඊ) ලෝන .. .. .. | 281·7 | 338·1 | 444·8 | + 106·7 |
| එකතුව .. .. .. | 832·7 | 924·8 | 1,029·6 | + 104·8 |

* මෙම වර්ගයට එකතු කිරීම සඳහා යවනු ලබන චෙක්පත් වලින් පෙනෙන අන්තර් බැංකු ණයෙන් ඉතා සුළු කොටසක් පමණක් ඇතුළත් වෙයි. එය ප්‍රධාන වශයෙන්ම, සහතික මිල ක්‍රමය යටතේ ආහාර ද්‍රව්‍ය මිළට ගැනීම සඳහා සමුපකාර ආයතන වලට දෙනු ලබන ඉතා කෙටි කාලීන අත්තිකාරම් සහ මිළට ගන්නා ලද ද්‍රව්‍ය වලින් සමන්විත වෙයි.

1967 දී පෞද්ගලික අංශයට දුන් ණය හා අයිරා රුපියල් දශ ලක්ෂ 134 කින් පැහැදිලි ලෙස වැඩි වූ අතර, 1966 දී එය වැඩි වූයේ රුපියල් දශ ලක්ෂ 65 කිනි. පෞද්ගලික අංශය සඳහා වූ ණය ප්‍රසාරණය වර්ෂය තුළ දී ඒකාකාර ලෙස පැතිරී නොපැවතින. බැංකු සේවකයන්ගේ වැඩ වර්ජනයක් හේතුකොටගෙන පෙබරවාරි හා මාර්තු මාස වල දී සැහෙන මූලික වැඩිවීමකට අනතුරුව, ණය ප්‍රසාරණය අගෝස්තු අවසානය දක්වා පිරිහුනි. ඉන් අනතුරුව මුදල් ප්‍රසාරණයක් පැවතියේ සැප්තැම්බර් දෙසැම්බර් කාලඡේදයේදීය.

පෞද්ගලික අංශයට වැඩිපුර ණය මුදල් අවශ්‍ය වූයේ ප්‍රධාන වශයෙන් ම ඉහළ මට්ටමක පැවති ආර්ථික කටයුතු සඳහා මුදල් ලබා ගැනීමටය. මෙම වැඩිවීමෙන් සැහෙන කොටසක් නව කෘෂිකාර්මික ණය ක්‍රමය යටතේ මුදා හරින ලද රුපියල් දශ ලක්ෂ 44 ක මුදල බව මෙම වාර්තාවේ අන් තැනක විස්තර කර ඇත. මහ බැංකුව විසින් කළ බැංකු තැන්පතු හා අත්තිකාරම් පිළිබඳ සමීක්ෂණයෙන් පෙන්වන අන්දමට වෙළඳ බැංකු විසින් කාර්මික අරමුණු සඳහා රුපියල් දශ ලක්ෂ 32 ක්ද වානිජ අරමුණු සඳහා රුපියල් දශ ලක්ෂ 30 ක්ද මූල්‍ය අරමුණු සඳහා රුපියල් දශ ලක්ෂ 8 ක්ද කෘෂි-කාර්මික අරමුණු සඳහා රුපියල් දශ ලක්ෂ 62 ක්ද ලබා දී ඇත. පාරිභෝජක අරමුණු සඳහා ලබාදුන් අත්තිකාරම් රුපියල් දශ ලක්ෂ 21 කින් ඉහල ගියේය. මේ අනුව වෙළඳ බැංකු ලබාදුන් අත්තිකාරම් වලින් සැහෙන කොටසක් නිෂ්පාදන අරමුණු සඳහා බව පෙනේ. මෙය 1967 දී පෞද්ගලික අංශයට ණය දීමෙහි දක්නට ලැබුණු ඉතා සතුටුදායක ලක්ෂණ යයි.

(ඇ) මුදල් සැපයුම

1966 දෙසැම්බර් අවසානයේ සිට 1967 අවසානය අතරේ දී මුදල් සැපයුම රුපියල් දශ ලක්ෂ 149 කින් හෙවත් සියයට 9 කින් වැඩි විය. කෙසේ වෙතත් වර්ෂය තුළදී සිදුවූ මුදල් සැපයුමේ වැඩිවීම ඒකාකාර නොවීය. ඇත්ත වශයෙන් බලතොත් 1966 අවසාන මාස පහ තුලදීත්, 1967 ජනවාරියේදීත් පහළ වැටුණු මුදල් සැපයුම පෙබරවාරියේ දී හා මාර්තුවේ දී තියුණු ලෙස ඉහළ ගියේ වෙළඳ බැංකු සේවකයන්ගේ වැඩ වර්ජනය නිසාය. ඉන් අනතුරුව අගෝස්තු දක්වා මුදල් සැපයුම පහල වැටිනි. කෙසේ වෙතත්, 1967 අවසාන මාස හතරේ දී මුදල් සැපයුමේ තියුණු වැඩිවීමක් පෙන්නුම් කළ අතර, 1966 අවසාන මාස පහේ දී මීට වෙනස් ලෙස පහල ගියේය. මේ අනුව වර්ෂ දෙක අවසානයේ පැවති සංඛ්‍යා සසඳන විට, මුදල් සැපයුමෙහි අතිශයෝක්තිය වැඩිවීමක් පෙනේ.

1967 මුදල් සැපයුමෙහි සාමාන්‍ය මට්ටම 1966 හා සසඳන කල වඩාත් තාත්වික සිතුවමක් පෙන්නුම් කරයි. 1967 මුදල් සැපයුමේ මාසික සාමාන්‍ය මට්ටම වන රුපියල් දශ ලක්ෂ 1732 ඉකුත් වර්ෂයේ දී පැවති රුපියල් දශ ලක්ෂ 1686 ට වඩා වැඩි වන්නේ සියයට 2·7 කින් පමණි. 1967 වැඩිවීමේ වේගය වන සියයට 2·7 ඉකුත් වර්ෂයේ සටහන් වී ඇති අනුපාතය වන සියයට 2·2 ට වඩා, එතරම් වැඩි නැත.

මුදල් සැපයුමට (1966 දෙසැම්බර් අවසානය සිට 1967 දෙසැම්බර් අවසානය දක්වා) හේතු වූ සාධක 1-3 සංඛ්‍යා සටහන මගින් සංක්ෂිප්ත කොට ඇත.

## 1-3 සංඛ්‍යා සටහන
## මුදල් සැපයුමෙහි වෙනස 1966 දෙසැම්බර් අවසානයේ සිට 1967 දෙසැම්බර් දක්වා)

රුපියල් දශ ලක්ෂ

| | | |
|---|---|---|
| **ප්‍රසාරණාත්මක සාධක** | | |
| (අ) පෞද්ගලික අංශයට දෙන ලද බැංකු ණය .. .. | 92·4 | |
| (ආ) රජයේ සංස්ථාවලට දෙන ලද බැංකු ණය .. .. | 11.4 | |
| (ඇ) බැංකු ක්‍රමයෙන් රජයට දුන් ණය .. .. | 192.7 | |
| (ඈ) රජයේ මුදල් ශේෂවල අඩුවීම .. .. | 56.0 | |
| (ඉ) මහ බැංකුවේ අනෙකුත් වගකීම් හා ගිණුම් (ශුද්ධ) අඩුවීම .. | 13·9 | 373·4 |
| **සංකෝචනාත්මක සාධක** | | |
| (අ) බැංකු විදේශීය වත්කම්වල (ශුද්ධ) අඩුවීම .. ,. | 91.5 | |
| (ආ) පෞද්ගලික අංශයේ කාලීන හා ඉතිරි කිරීම් තැන්පතුවල වැඩිවීම .. | 50·9 | |
| (ඇ) රජයේ සංස්ථාවල කාලීන හා ඉතිරි කිරීම් තැන්පතුවල වැඩිවීම .. | 51.2 | |
| (ඈ) වෙළඳ බැංකුවල අනෙකුත් වගකීම්වල (ශුද්ධ) වැඩිවීම .. | 31.0 | |
| (ඉ) ගැලපිළි .. .. .. | 0.1 | 224·7 |
| මුදල් සැපයුමේ වැඩිවීම .. .. .. | | 148·7 |

රාජ්‍ය අංශයෙහි කටයුතු මුදල් සැපයුම කෙරේ විශාල ප්‍රසාරණාත්මක බලපෑමකට තුඩුදුනි. බැංකු ක්‍රමයෙන් රජයට දුන් ණය රුපියල් දශ ලක්ෂ 200 කින් ඉහළ ගිය අතර, රජයේ මුදල් ශේෂ රුපියල් දශ ලක්ෂ 56 කින් පහළ වැටුණි.

මුදල් සැපයුම් සංඛ්‍යා තොරතුරු වලින් පෙන්වන රාජ්‍ය මූල්‍ය කටයුතුවල මෙම ප්‍රසාරණාත්මක බලපෑම සහ 1966/67 අය වැය සාංඛ්‍ය තොරතුරු වලින් පෙන්වා ඇති සුළු ප්‍රසාරණාත්මක බලපෑම අතර ඇති පැහැදිලි වෙනස පිළිබඳව විස්තර කිරීමක් අවශ්‍යය. කලින් ද දැක්වූ පරිදි, මුදල් සැපයුමෙහි තියුණු ප්‍රසාරණයක් ඇති වූයේ, වර්ෂයේ අවසාන මාස හතර තුළ වන අතර, ඉන් මාස තුනක් 1966/67 මුදල් වර්ෂය අවසන් වූවාට පසු පැමිණි මාසයන්ය. මෙය තත්ත්වය තරමක් දුරට විස්තර කරයි. රජයට දුන් බැංකු ණය වැඩිවීමේ හා මුදල් ශේෂ අඩුවීමේ මුළු ගණන වූ රුපියල් දශ ලක්ෂ 255·7 න්, රුපියල් දශ ලක්ෂ 148 ක තරම් විශාල ප්‍රමාණයක් 1967 සැප්තැම්බර් හා දෙසම්බර් මාස අවසාන අතරේ සිදුවිය මේ කාලච්ඡේදය තුළදී රජය ආහාර තොග රැස්කළ අතර, ඒ සඳහා කළ ගෙවුම් වලින් කොටසක් ලබා ගන්නා ලද්දේ බැංකු ක්‍රමයෙනි. බැංකු ක්‍රමය රජයට ණය ලබා දුන්නේ රජයේ ආනයන (ආහාර) බිල්පත් ලබා ගැනීමෙනි. ප්‍රධාන වශයෙන් රජයේ ආහාර තොග එකතු වීමේ ප්‍රතිඵලයක් ලෙස බැංකු මගින් දරණ ලද ආනයන බිල්පත් වටිනාකම රුපියල් දශ ලක්ෂ 140 කින් වර්ෂය තුළදී වැඩිවිය.

පෞද්ගලික අංශයට සහ රජයේ සංස්ථාවලට දුන් ණය (රුපියල් දශ ලක්ෂ 1 ක අපනයන බිල්පත් ඇතුලත් නොවේ) වැඩිවීම හේතු කොට ගෙන ඇතිවූ රුපියල් දශලක්ෂ 104 ක මුදල් සැපයුමේ ප්‍රසාරණය ඒවායේ රුපියල් දශලක්ෂ 102 ක කාලීන හා ඉතිරි කිරීම් තැන්පතුවල වැඩිවීම නිසා මුළුමනින්ම වාගේ පියවී ගියේය මෙයට විරුද්ධ ලෙස 1966 දී පෞද්ගලික අංශය (රාජ්‍ය සංස්ථා ඇතුළුව) රුපියල් දශ ලක්ෂ 71 ක ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කළේය

රාජ්‍ය හා පෞද්ගලික අංශයන් මුදල් සැපයුම කෙරෙහි ප්‍රසාරණාත්මක බලපෑම විදේශීය බැංකු වත්කම් රුපියල් දශ ලක්ෂ 92 කින් පහළ යාමෙන් තරමක් දුරට හිලව් වී ගියේය. 1966 දී විදේශීය බැංකු වත්කම් වල පිරිහීම මෙයට වඩා වැඩිවූ අතර , එය රුපියල් දශ ලක්ෂ 196·2 ක් විය.

සංක්ෂිප්ත වශයෙන් බලතොත් 1967 මුදල් සැපයුමේ ප්‍රසාරණය ඇති වූයේ, රජයට දුන් බැංකු ණය ඉහළ යෑම, රජයේ මුදල් ශේෂවල පිරිහීම සහ පෞද්ගලික අංශයට වෙළෙඳ බැංකු මගින් සැපයූ ණය වැඩිවීම යන කරුණු මුල් කොට ගෙනය.

මුදල් සැපයුමට මෙම සාධකයන් ගෙන් ඇතිවූ ප්‍රසාරණාත්මක බලපෑම විදේශීය බැංකු වත්කම් පිරිහීමෙන් හා ධෛර්‍ය්‍ය ගෙන දෙන සුළු වර්ධනයක් වන වෙළෙඳ බැංකු වෙතැති ඉතිරි කිරීමේ තැන්පතු ඉහළ යෑම නිසා තරමක් දුරට මග හැරී ගියේය.

## (3) 1967 දී විදේශීය ගෙවුම්

දෘශ්‍ය හා අදෘශ්‍ය යන දෙවර්ගයේම අපනයන ඉපැයීම් පහළ වැටීම ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන උද්ගතවූ විදේශීය ගෙවුම් තත්ත්වයෙහි පිරිහීම තව දුරටත් 1967 දී ද පැවති හෙයින් 1966 දී පැවති බරපතල විදේශීය ගෙවුම් දුෂ්කරතා මේ වර්ෂයේ ද පැවතිණ. රුපියල් දශ ලක්ෂ 1997 ක පැවති ආනයන ගෙවුම් ඉකුත් වර්ෂයේ පැවතියට වඩා අඩුවූයේ, රුපියල් දශ ලක්ෂ 21 කින් පමණක් වන අතර, භාණ්ඩ අපනයනය කිරීමෙන්වූ ලැබීම් රුපියල් දශ ලක්ෂ 28 කින් අඩුවෙද්දී අදෘශ්‍ය ලැබීම් රුපියල් දශ ලක්ෂ 32 කින් අඩුවිය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් වර්තන ගිණුමේ හිඟය 1966 දී පැවති රුපියල් 290 සිට 329 දක්වා වැඩිවිය. 1–4 සංඛ්‍යා සටහන මගින් 1962 සිට 1967 දක්වා ගෙවුම් ශේෂයේ වාර්ෂික තත්ත්වය පෙන්නුම් කෙරේ.

### 1 – 4 සංඛ්‍යා සටහන
### ලංකාවේ ගෙවුම් ශේෂය
### 1962 – 1967

රුපියල් දශ ලක්ෂ

| | 1962 | 1963 | 1964 | 1965 | 1966 | 1967 (අ) |
|---|---|---|---|---|---|---|
| 1. වෙළඳ භාණ්ඩ | | | | | | |
| අපනයන නැ. වි. ස. .. | 1,763 | 1,708 | 1,767 | 1,909 | 1,674 | 1,646 |
| ආනයන මි. ර. ගැ. .. | —1,906 | —1,869 | —1,960 | —1,922 | —2 018 | —1,997 |
| වෙළඳ ශේෂය .. | — 143 | — 161 | — 192 | — 13 | — 344 | — 351 |
| 2. සේවා .. | — 4 | — 20 | — 7 | — 31 | 16 | — 1 |
| 3. සංක්‍රාම ගෙවුම් .. | 7 | 13 | 40 | 40 | 37 | 22 |
| 4. වර්තන ගිණුම් ශේෂය .. | — 140 | — 168 | — 160 | 59 | — 290 | — 329 |
| **මුදල් ලබාගත් ක්‍රමය** | | | | | | |
| 5. පෞද්ගලික ප්‍රාග්ධන | | | | | | |
| (i) දිගු කාලීන .. | — 2 | + 5 | + 1 | — 4 | — 16 | — 6 |
| (ii) කෙටි කාලීන .. | — | — 5 | — 9 | — 18 | — 18 | + 9 |
| 6. රජයේ හා බැංකු ප්‍රාග්ධනය (අ) | | | | | | |
| (i) දිගු කාලීන විදේශීය වගකීම්වල (ශුද්ධ) වෙනස්වීම් .. | + 40 | + 75 | + 7 | + 36 | + 153 | + 167 |
| (ii) කෙටි කාලීන විදේශීය වගකීම්වල (ශුද්ධ) වෙනස්වීම් .. | + 44 | + 46 | + 59 | + 22 | + 71 | + 268 |
| (iii) විදේශීය වත්කම් වල වෙනස් වීම් .. | + 28 | + 42 | + 111 | — 89 | + 122 | — 131 |
| (iv) අනෙකුත් .. | — | — | — | — | — 2 | — 2 |
| 7. වැරදි සහ අත්හැරීම් .. | + 31 | — 4 | — 8 | — 6 | — 16 | + 25 |

(අ) තාවකාලිකයි.

(ආ) ධන ලකුණින් වත්කම් අඩුවීම හෝ වගකීම් වැඩිවීම හෝ දක්වේ.

1967 වසර සඳහා වූ විදේශ විනිමය අයවැය ලේඛනය රුපියල් දශ ලක්ෂ 1776 ක අපනයන ඉලක්කය මත පදනම් විය. වසර සඳහා වූ අපනයන ඉපයීමේ රුපියල් දශ ලක්ෂ 1646 ක් පමණක් වූයේ ඉලක්කය ට වඩා රුපියල් දශ ලක්ෂ 130 කින් සහ 1966 ඉපැයීම් වලට වඩා රුපියල් දශ ලක්ෂ 28 කින් පහල වැටුනි 1967 අපනයන ඉපැයීම්, 1953 වසරේ සිට වාර්තා ගත පහළම ඉපැයීම විය. අපනයන වල බලාපොරොත්තු කඩවන සුළු හැඩගැස්මට හේතු වූයේ ප්‍රධාන අපනයන භාණ්ඩ තුනෙහිම මිල පහල වැටීමත් සමග පොල් නිෂ්පාදිත හා රබර්වල අපනයන පරිමාව අඩුවීමත් එය මදකින් මොලු තේ අපනයන පරිමාවෙහි වැඩිවීමත්හි ඒකාබද්ධ ප්‍රතිඵලය නිසාය.

1967 සඳහාවූ විදේශ විනිමය අයවැය ලේඛනය සකස් කරන අවස්ථාවෙහි, ආනයන වැඩ සටහන රුපියල් දශ ලක්ෂ 2519 ක් විය. ඉන් අනතුරුව පිරිහෙමින් පැවැති ගෙවුම් ශේෂ තත්වයට අනුව, පසුව එය රුපියල් දශ ලක්ෂ 2231 දක්වා අඩු කරන ලදී. සත්‍ය වශයෙන් නිකුත් කළ බල පත්‍ර වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 2,055 ක්වූ අතර, ගෙවීම් අඩු වූයෙන් රුපියල් දශ ලක්ෂ 1,997 ක්ව පැවැතියේය. අපනයන ඉපැයීම් පහළ වැටීමක් තිබියදී මෙතරම් විශාල ආනයන වැඩ සටහනක් මුදල් කිරීමට හැකි වූයේ, ප්‍රධාන වශයෙන් භාණ්ඩ ආධාර වැඩ සටහන් යටතේ සහ අන්තර් ජාතික මූල්‍ය අරමුදලින් ණය ගැනීම් වලින් සෑහෙන පමණ විදේශ සම්පත් ගලා ඒමට සැලැස්වීමෙන් පමණි. 1965 සහ 1967 අතර කාලයේ දී භාණ්ඩ ආධාර වැඩ සටහන් තුනක් පිළිබඳව සාකච්ඡා පවත්වා තීරණ ගෙන ඇත. මෙම වැඩ සටහන් යටතේ ලැබුණු ආධාර 1966 වසරට වඩා 1967 දී සැලකිය යුතු ලෙස වැඩි අතර, එය රුපියල් දශ ලක්ෂ 208 ක් වූයේ, ඉකුත් වසරෙහි ලැබීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 120 ක් වීමෙන්ය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් කළ හැර ගැනුම් රුපියල් දශ ලක්ෂ 123 ක් විය. 1966 ජූනි 15 වෙනි දින අත්සන් කර තිබූ දෙවෙනි සමීපසථ ගිවිසුම යටතේ අවසාන ආධාර කොටස වන රුපියල් දශ ලක්ෂ 30, 1967 මාර්තුවේ දී හැරගන්නාලදී. 1966 දී පැවැති අපනයන ඉපැයීම් වල තියුණු පිරිහීම් හේතු කොට ගෙන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ වන්දි මුදල් කිරීමේ ක්‍රමය යටතේ රුපියල් දශලක්ෂ 93 හැර ගැනීමට ලංකාව සුදුසුකම් ලැබුවාය. මෙම ක්‍රමය යටතේ හැර ගැනීම් 1967 යටතේ, මාර්තුවේදී සිදුකරන ලදී. 1967 දී නැවත මිලදී ගැනීම් රුපියල් දශ ලක්ෂ 18 ක්වූ හෙයින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් 1967 දී කළ ශුද්ධ හැර ගැනීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 105 ක් විය. මෙය 1965 දී කළ රුපියල් දශ ලක්ෂ 74 ක හැර ගැනීම් හා 1966 දී කළ රුපියල් දශ ලක්ෂ 90 ක හැර ගැනීම් හා සැසඳේ. පසුගිය වර්ෂ තුනේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් කළ හැර ගැනීම්, සෑහෙන විදේශීය සම්පත් ප්‍රමාණයක් ලබා දුන් බව සඳහන් කිරීම සුදුසුය.

බාහිර වත්කම් සංඛ්‍යාව (ශුද්ධ ස්ටර්ලින් ණය නිදන් අරමුදල්) රුපියල් දශ ලක්ෂ 125 කින් ඉහළ යෑමක් පෙන්නුම් කලත් ගෙවුම් ශේෂයෙහි පිරිහීමක් විය. අහම්බෙන් ඇතිවූ වැඩිවීමට මුළුමනින්ම හේතු වූයේ 1967 දී අවසාන වශයෙන් ලබා ගත් විවිධ ණය ගැනීම් වලින්ම ඇතිවූ ප්‍රතිඵලයන් ය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ගත් සෑහෙන තරමක ශුද්ධ හැර ගැනීම් ප්‍රමාණයට අමතරව රුපියල් දශ ලක්ෂ 57·1 ක විදේශීය බැංකුවලින් ගත් තාවකාලික හැරගැනීම් හා රුපියල් දශ ලක්ෂ 80 ක ගෙවීම් සම්මුතිය යටතේ ඇති වගකීම් ද විය. පසුගිය වර්ෂය අවසානයේ සහ 1967 දෙසැම්බර් අවසානය අතර රුපියල් දශ ලක්ෂ 117 කින් මහ බැංකුවේ ජාත්‍යන්තර සංචිත වැඩිවීම, මෙවැනි අහම්බෙන් සිදුවන හේතූන් නිසා ඇති විය.

සංක්ෂේප වශයෙන් සලකා බලතොත් ඉකුත් වර්ෂ කිහිපය තුලදී දක්නට ලැබුණු පිරිහීමේ ප්‍රවනතාවය 1967 දීද ගෙවුම් ශේෂයෙහි තත්ත්වයෙන් පිළිබිඹුවූ අතර ලංකා රජයේ ශුද්ධ විදේශිය වගකීම් රුපියල් දශ ලක්ෂ 403 කින් පමණ වැඩිවීමට හේතු විය.

## (4) ප්‍රතිපත්ති හා විධිවිධාන

**රුපියල අවප්‍රමාණ කිරීම:**

ඉකුත් වර්ෂ කිහිපයතුලදීම පාහේ නොකඩවා පැවති ගෙවුම් ශේෂයේ පිරිහීමේ සමුච්චිත ප්‍රතිවිපාකයෙනුත් ස්ටර්ලින් පවුම් අවප්‍රමාණ කිරීමත් හේතුකොටගෙන 1967 නොවැම්බර් 22 දින ලංකා රුපියල සියයට 20 කින් අවප්‍රමාණ කිරීමට හේතු විය. 1960 සිටම ලංකා රුපියලේ සම මිල පවත්වාගෙන යන ලද්දේ විදේශීය ගෙවුම් වලදී එන්ට එන්ට දැඩිවන පාලනයක් මගින් පමණි. 1960 දී ලංකාවේ විදේශිය සංචිත රුපියල් දශලක්ෂ 458 ක්වූ, පහත් පට්ටමකට ලඟාවී තිබුණි. එතැන් පටන් විනිමය පාලන වැඩි වැඩියෙන් දැඩි කලත්, එසේම විදේශීය ණය ගැනීම්වල පිහිට සෑහෙන තරමකින් සෙව්වත් 1966 අවසානය වන විට විදේශිය වත්කම් අතිශයින් අවදානම් සහිත මට්ටමක්වන රුපියල් දශ ලක්ෂ 282 කට පහළ වැටුණි.

1966 ජූනි මාසයේදී ඉන්දියාව ඇගේ මුදල අවප්‍රමාණ කළ විට, ලංකා රජය සුපරීක්ෂාරී ලෙස, සලකා බැලීමෙන් පසු රුපියල එම මට්ටමට අවප්‍රමාණ නො-කිරීමට තීරණය කළේය. අවප්‍රමාණ කිරීමෙන් පසු තේ අපනයනය සම්බන්ධයෙන් ලැබුණු තරගකාරී වාසිය, ඉන්දිය රජය විසින්, ඇගේ තේ අපනයනවලට එම අවස්ථාවේදීම පැනවූ අධික අපනයන තීරු ගාස්තු නිසා, බොහෝදුරට මැකී ගියේය. එයට පසු කෙසේ නමුත්, තේ සඳහා ඉන්දීය අපනයන තීරුබදු සංශෝධනය කෙරිණ. ලංකාවේ ගෙවුම් ශේෂයේ පිරිහීම තවදුරටත් සිදුවිය. මෙම තත්ත්වය යටතේ හා ස්ටර්ලින් පවුම සියයට 14·3 කින් අවප්‍රමාණ කිරීම අනුව 1967 නොවැම්බර් 22 වෙනි දින සියයට 20·0 කින් ලංකා රුපියල අවප්‍රමාණ කරනු ලැබිය. මෙය ස්ටාර්ලින් පවුම අවප්‍රමාණ කළ ප්‍රමාණයට වඩා තරමක් වැඩිය.

වෙනත් තැනක සඳහන් කරන ලද පරිදි එම අවස්ථාවේදීම රුපියල අවප්‍රමාණ කිරීම නිසා ජීවන වියදම කෙරෙහි ඇතිවූ බලපෑම් මකාලීමට සහ අපනයන අංශය මගින් ලබා ගන්නා අමතර රුපියල් ආදායමේ කොටසක් උකහා ගැනීමට වෙනත් පියවර කිහිපයක් ද ගන්නා ලදී. රජයේ සේවාවේ පහළ වැටුප් කොට්ඨාශවලට එක්තරා වැටුප් වැඩිවීමක් ලබාදුන් අතර පෞද්ගලික අංශයේ සහ රාජ්‍ය සංස්ථාවල එම ශ්‍රෙණිවල වැටුප් උපයන්නන්ටද මෙම ගෙවීම කිරීමට මුල් පියවර ගනු ලැබිය. මෙම කාලච්ඡෙදයේදී සිය මුදල් අවප්‍රමාණ කල එක්සත් රාජධානිය වැනි අනෙකුත් රටවල වැටුප් සීමා කිරීමේ ප්‍රතිපත්තියට ප්‍රති විරුද්ධ වූවකි. මෙම වැටුප් වැඩි කිරීම, ඒවායේ තත්ත්වාකාරයෙන් විමර්ශනය කල. යුතුය. මුදලේ වටිනාකම අවප්‍රමාණ කිරිමට පෙර පවා අඩු වැටුප් ලැබූ කොටස් වල වැටුප් වැඩි කිරීමේ ඉල්ලීම් තිබූ අතර අවප්‍රමාණ කළ ද නොකළ ද ඒවා විසඳිය යුතු විය. අවප්‍රමාණය කිරීමෙන් මෙම ඉල්ලීම් වඩා පහසුවෙන් ලබාගත හැකි තත්ත්වයක් උදා කළේය.

ලංකා රුපියල සියයට 20 කින් අවප්‍රමාණ කිරිම ප්‍රධාන නිෂ්පාදන ද්‍රව්‍ය අපනයනිකයන්ට සෑහෙන අනුබලයක් ලබා දෙනු ඇත. අපනයනිකයනට ලැබුන ආන්තික වාසිය අධිකයයි කල්පනා කළ හෙයින් එයින් කොටසක් අපනයන තීරු බදු මගින් අඩු කරනු ලැබිය. කෙසේ වෙතත්, ලංකාව අපනයන ඉපැයීම් වැඩිකර ගැනීමට ගන්නා ප්‍රයත්නය කාර්මික භාණ්ඩ සමූහයකට හා සුළු කෘෂිකර්ම භාණ්ඩ කෙරෙහි යොමු විය යුතුය. අවප්‍රමාණ කිරීම, නිෂ්පාදකයන්ට අපනයන

නව වෙළෙඳ පොළවලට පුළුල් කිරීමට අමතර අනුබලයක් ලබාදුන්නේ වී නමුත්, අතිශයින් තරඟකාරී වෙළෙඳ පොළවලට ඇතුළු වීම සඳහා අවප්‍රමාණ කිරීමකින් පමණක් ලබාදෙන අනුබලයට වඩා වැඩි අනුබලයක්හා උනන්දු කිරීමක් අවශ්‍යය.

අවප්‍රමාණ කිරීම, අපනයනිකයන්ට අනුබල ලබාදෙනවා හැරෙන්නට, දේශීය මිල, හිඟ අඟයකින් යුත්, විදේශීය විනිමයට අනුකූල ලෙස හැඩගැසීමට ද බලාපොරොත්තු වෙයි. මෙම පරමාර්ථය ඉටු කරගත හැකි නම්, විදේශීය ගෙවුම් පාලනය කොට තිබෙන විධිවිධාන වලින් සෑහෙන කොටසක් ඉවත් කළ හැකිය. කෙසේ වෙතත් තවමත් ආර්ථිකයේ අනවශ්‍ය ද්‍රවශීලතාවයක් පවතියි. මෙම තත්වය මේ වාර්තාවේ මුදල් හා බැංකු හැඩගැස්ම යටතේ විශ්ලේශණය කොට දක්වා ඇති බැංකු නොවන අංශයේ ද්‍රවශීලතාවය පිළිබඳ දත්තයන්ගෙන් තහවුරු වෙයි. මෙවැනි තත්වයක් යටතේ විදේශීය ගෙවුම් හා සම්බන්ධ පාලන එක්වරම ඉවත් කිරීම, හානිකර විය හැකි වන අතර එසේ නොකිරීමට ගත් තීරණය බුද්ධි ගෝචරය.

කෙසේ වෙතත්, මුදල් හා රාජ්‍ය මූල්‍ය අංශයෙහි ප්‍රමාණවත් ආරක්ෂණ සලසමින් එයට අනුපූරක විධි විධානද ගනිමින් ක්‍රමයෙන් මෙම පාලන වලින් ඉවත් කිරීමට යෝග්‍ය අවධිය දූන් උදා වී තිබේ. මෙතැන්හි අවශ්‍ය වී ඇත්තේ ආනයන හා අදාශ්‍ය ගෙවුම් සම්බන්ධයෙන් කරන පූර්ණ නිදහස් කිරීමක් නොවේ. අනෙක් අතට, යහපත් හේතූන් නිසා වුවද, අතීතයේ දැඩි පාලන බාධාවන් යටතේ අවික්‍රමයට නවගතිකත්වයක් ඇතුළු කිරීමෙන් අවප්‍රමාණය කිරීමේ සම්පූර්ණ ප්‍රතිඵල ලබාගැනීම සඳහා වඩාත් සුපරීක්ෂා කාරීව හා මනාව තෝරාගත් ක්‍රියා මාර්ගයන් අනුගමනය කිරීම වඩාත් නුවණට හුරුවන්නේය.

මුදල් අවප්‍රමාණය කිරීමේ ප්‍රතිඵල අර්ථ ක්‍රමයට දැනෙනුයේ සෑහෙන කලක් ඉකුත්වීමෙන් පසුවය. අවසානවශයෙන් බලතොත් විනිමය අවප්‍රමාණ කිරීම වසර කිහිපයක කාලයක් තිස්සේ පැවති ආර්ථික අයෝග්‍යතාවන්හි සමුච්චිත ප්‍රතිඵල-යක් වන මූලික අසම තුලිත තාවය නිවරද කිරීමකි. එවැනි අසමතුලිතතාවයක් නිවරද කිරීමටද කලක් ගතවෙයි. අව ප්‍රමාණ කිරීමත් සමගම ඇතිවන අපනයන වල රුපියල් මිලෙහි ක්ෂණික වැඩිවීම ගැන උද්දාමයට පත්වීමත්, දේශීය මිල ඉහළ නැගීම ගැන අධෛර්‍යයට පත් වීමත් එකලෙසින්ම නුසුදුසුය. අවශ්‍ය තරම් කාලයක්, ප්‍රමාණ-වත් මූල්‍ය සංවරතාවයකුත්, අනුපූරක ප්‍රතිපත්තින්, ලබා දෙන්නේ නම් අවප්‍රමාණ කිරීමෙන්, ආර්ථිකයට වාසි සැලසෙනු ඇත.

### කෘෂිකර්ම අංශයෙහි ආදේශණය

ආහාර ආනයනයේ දී විදේශ විනිමයෙන් ඇතිවන පීඩනය ලිහිල් කිරීමේ අදහසින් ඉක්මන්කාරී කෘෂිකාර්මික සැලසුමක් ඇතිවීම ගැන පසුගිය වාර්ෂික වාර්තාවේ සඳහන් කරන ලදී. ආහාර භාණ්ඩාගාර ක්‍රමයේ 1966 දෙසැම්බර් 18 වැනිද සිට ක්‍රියාත්මක වූ වෙනස් කම් පිළිබඳව ද පසුගිය වාර්තාවේ සඳහන්වුනි. මෙම වෙනස්වීම යටතේ සතියකට එක් අයෙකුට දුන් සහල් සලාකය සේරු දෙක එක සේරුවක් වන වනසේ අතල අතර එයද නොමිලේ බෙදදෙන ලදී.

සහල් සලාකය අඩු කිරීමේ ක්ෂණික ප්‍රතිඵලය වූයේ විවෘත වෙළඳ පොළේ සහල් මිල ඉහළ යාමයි. මෙම වෙනස ඇති වූයේත් දේශීය වෙළඳ පොළේ සහල් සැපයුම පහළ මට්ටමකට බසින වකවානුවේදීමය. එයට හේතුව දෙසැම්බරයේදී ලංකාවේ කවර පෙදෙසකවත් අස්වනු කාලයක් නොවීමයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් තියුණු සහල් හිඟයක් පැවති පසුගිය යුද සමයෙ දී මෙයත් ඉහල නැගි මට්ටමටම විවෘත වෙළඳ පොළේ සහල් මිල ඉහල නැගුනි. ඒ නිසා විවෘත වෙළඳ පොළේ උසස් වර්ගයේ සහල් සේරුවකට 1966 දෙසැම්බර් සහ 1967 ජනවාරි, පෙබරවාරි

වලදී, රුපියල් දෙකක් පමණ මිලක් ලබාගත හැකිවිය. 1967 පෙබරවාරි, අප්‍රේල් මාස වල මහ කන්නයේ සැලකිය යුතු අස්වැන්න සහ 1967 ජූලි, අගෝස්තුවල යහපත් යල කන්නයේ අස්වැන්න වෙළඳ පොළට පැමිණීමත් සමග විවෘත වෙළඳ පොළේ මිල පහළ මට්ටමක ස්ථාවරව තිබුණි. මුළු වර්ෂයම ගත්කල, වී බුසලක සාමාන්‍ය මිල රුපියල් 13.60 ක් පමණවූ අතර, 1960 වර්ෂයේදී එය, බුසලක් රුපියල් 11.05 ක් වූයේ වර්ෂ දෙක තුලදී මිල රුපියල් 2.55 කින් වැඩි විය. ලංකා රුපියල අවප්‍රමාණය කරන අවස්ථාවේ ම වී බුසලක සහතික මිල රුපියල් 12.00 සිට රුපියල් 14.00 දක්වා වැඩි කරන ලදී.

විවෘත වෙළඳ පොළේ සහල් මිල විටින් විට උච්චාවචනය වීමට ඉඩ ඇත. එසේ නමුදු 1967 දී විවෘත වෙළඳ පොළේ මිල 1966 පැවති සාමාන්‍ය මිලට වඩා වැඩිය පොහොර වැඩියෙන් යෙදීමටත්, වඩා හොඳ බිත්තර වී යෙදීමටත්, අක්කර ප්‍රමාණය පුළුල් කිරීමටත්, පොදුවේ වඩා හොඳ වගා ක්‍රම අනුගමනය කිරීමටත් ගොවියන් උනන්දු කරවීම සඳහා රජය ආහාර නිෂ්පාදන ව්‍යාපාරයක් ගෙනයන ලදී. මෙම දිරිගන්වන සුළු විධිවිධානවල හා සතුටු දායක කාල ගුණ තත්ත්වයේ ඒකාබද්ධ ප්‍රතිඵලයක් වශයෙන් 1967 දී වී අස්වැන්න අන් කවර කාලයකටත් වඩා ඉහළ නැග බුසල් දශ ලක්ෂ 55·1 කට හෙවත් දිගු ටොන් 7,69,000 කට පැමිණියේය.

දේශීය ආහාර නිෂ්පාදනය වැඩි කිරීම සඳහා සූක්ෂම ආහාර වගා ව්‍යාපාරයක් අනෙකුත් විධිවිධානද සකස් කොට තිබුණේ ආහාර ද්‍රව්‍ය වෙනුවෙන් විදේශීය විනිමය වැය කිරීම අඩු කිරීම සඳහාය. 1966 සහ 1967 වර්ෂ වලදී ආහාර ආනයනය සඳහා නිකුත් කොට තිබෙන විදේශ විනිමය බලපත්‍රවල අගය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ816 හා 834 ක් විය. මෙය රුපියල් දශලක්ෂ 18 ක වැඩිවීමක් හෙළි කරයි. කෙසේ වුවද, 1967 අවසානයේදී ආහාර කොමසාරිස් වරයා වෙත තිබූ ආනයනය කළ සහල් සහ පිටි තොග 1966 ට වඩා පිළිවෙලින් ටොන් 37,500 සහ 76,300 කින් වැඩි වූ බව මෙම තොරතුරු වලින් හෙළි නොවේ.

මේ සාධකය වෙනුවෙන් ඉඩ හැරීමෙන් පසු, 1967 වර්ෂයේ දී ආහාර සඳහා වූ නියම විදේශ විනිමය වියදම 1966 ට වඩා අඩු විය. ජන සංඛ්‍යාව ඉහළ යාම හේතු කොට ගෙන 1967 දී ආහාර අවශ්‍යතාවයන් 1966 ට වඩා වැඩි වූ බව ද අවබෝධ කර ගත යුතුය. මේ මගින් පෙනීයන්නේ ආහාර ආනයනයන් සඳහා විදේශ විනිමය වියදම් අඩු කරලීම සම්බන්ධයෙන් සැහෙන දියුණුවක් 1967 දී ලබා තිබූ බවය.

යහපත් කාලගුණයක් පැවතුනහොත්, 1968 වර්ෂයේ දී වඩා සඵල වූ බලාපොරොත්තු ඇති කර ගත හැකිය. 1967 නොවැම්බර් මාසයේ දී සහතික වී මිල ඉහළ දැමීමෙන්, 1967 දී පැවති මිලට වඩා ඉහළ මිලක් තමන්ගේ වී වෙනුවෙන් ලබා ගැනීමට ගොවියන්ට හැකිවෙයි. මහ බැංකුව ක්‍රියාශීලි අන්දමින් සහභාගි වූ ග්‍රාමීය කෘෂිකර්මාන්තය වෙනුවෙන් මුදල් කිරීමේ නව කෘෂිකාර්මික ණය ක්‍රමයක්, 1967/68 මහකන්නය ආරම්භයේ දී අරඹනු ලැබීය. දැනට මේ කන්නය සඳහා දී ඇති මුළු ණය අත්තිකාරම් ප්‍රමාණය දෙසැම්බර් අවසානයේදී රුපියල් දශලක්ෂ 84·1 වූයෙන් කලින් මුළු වර්ෂය සඳහා දුන් ප්‍රමාණය රුපියල් දශලක්ෂ 34·6 ට වඩා සැලකියයුතු අන්දමින් වැඩි වී ඇත. 1968 පොහොර යෙදීම වැඩි වනු ඇතැයි බලාපොරොත්තු වේ. වැඩි අස්වැන්නක් ලැබෙන බිත්තර වී යෙදවීමට වඩා දියුණු වගා ක්‍රමයන් අනුගමනය කිරීමට හා වගා බිම් ප්‍රමාණය පුළුල් කිරීමට, ගොවියන් උනන්දු කරවීම කරගෙන යනු ලැබේ. මේ සාධක සියල්ලෙන්ම පෙන්වනුයේ කාලගුණ තත්ත්වය අයහපත් නොවුන හොත් 1968 නිෂ්පාදනය 1967 ට වඩා සැලකිය යුතු අන්දමින් ඉහළ යන බවයි. අනෙකුත් ආහාර ද්‍රව්‍යයන් වෙනුවෙන් ද, යහපත් බලාපොරොත්තු ඇති කළ හැකිය. 1967 දී මිරිස්, බොම්බයි ළූණු සහ අර්තාපල් (1967 මැද භාගයේ සිට නවතා දැමීය) වෙනුවෙන් කළ ආනයන විබෙදිය

අඩු වූ අතර, මෙය සිදුකළේ දේශීය නිෂ්පාදනයට අනුබල දීම් වස්ය. 1967 දී අතිරේක ආහාර ද්‍රව්‍ය නිමැවුමෙහි යම් වැඩිවීමක් දක්නට තිබුණි. මෙම උපනතිය තවදුරටත් පැවතුන හොත්, 1968 දී නිෂ්පාදනය වඩා වැඩි විය යුතුය.

**කර්මාන්ත අංශයෙහි ආනයන ආදේශනය**

වැඩි වූ නිෂ්පාදනය සහ යහපත් මිල තුලින් උද්ගත වූ ග්‍රාමීය අංශයෙහි මුදල් ආදායම්හි වැඩිවීම නිසා විශේෂයෙන් ග්‍රාමීය අංශයෙහි බොහෝ සෙයින් පාරිභෝජනය සඳහා ගැනෙන, ඇතැම් නිෂ්පාදිත භාණ්ඩ ආර්ථිකය වෙත ගලා ඒමට සැලැස්-වීමේ අවශ්‍යතාවය කෙරෙහි සැලකිල්ල යොමුවිය යුතුය. මෙමගින් ආර්ථිකයේ කාර්මික අංශයෙහි වැදගත් කම වඩා තියුණු අන්දමින් විදහා දක්වේ. වාර්තාවෙහි පසුව දක්වෙන සංඛ්‍යා තොරතුරු වලින් පෙනී යන පරිදි, 1967 දී පෞද්ගලික අංශයෙහි වූ කර්මාන්තයන්ගේ කටයුතුවල 1966 ට වැඩි දියුණුවක් තිබූ බවට සැහෙන සාක්ෂි ඇත. තේ, රබර්, පොල් නිෂ්පාදනයන් හැර අනෙකුත් නිෂ්පාදනයන්, 1966 ට වඩා 1967 දී යහපත් වූ බව, ජාතික ආදායම් දත්තයන් අනුව පෙනී යයි.

ග්‍රාමීය අංශයෙහි බොහෝ සෙයින් පාරිභෝජනය සඳහා අවශ්‍යවන්නා වූ භාණ්ඩ වර්ගයන් වනුයේ, බොහෝසේ පෞද්ගලික අංශයේ කර්මාන්තයන් මගින් නිෂ්පාදිත ඒවා වන අතර, පසුගිය වර්ෂයේ වාර්තාවේ සාකච්ඡා වූ අන්දමට, ගෙවුම් ශේෂ හේතූන් නිසා, ආනයනය සීමා කිරීම හා අනියම් වශයෙන් අත්හිටවුනු නොයෙකුත් වර්ගයේ භාණ්ඩයන් නිෂ්පාදනය කිරීමට මෙම කර්මාන්තයන් ආරම්භ වී ඇත. ඒවා බොහෝ දුරට ආනයන ආදේශන කර්මාන්ත බව, කාර්මික වර්ධනය පිළිබඳව මෙම වර්තාවේ කොටසක දක්වා ඇති තොරතුරුවලින් පෙනී යයි. මෙම කර්මාන්ත වල තවත් ලක්ෂණයක් නම් අත්‍යාවශ්‍ය නොවන භාණ්ඩ ආනයනය කිරීම තහනම් කිරීම නිසා ලැබුණු ආරක්ෂණය යටතේ මේවා වර්ධනය වීමය. එහෙයින්ම මෙකී කර්මාන්ත ජාතික ප්‍රමුඛතා, අවශ්‍යයෙන්ම නිරූපනය කරන්නේ නැත.

ආනයනය කළ අමු ද්‍රව්‍ය මත අධික ලෙස රැඳීම නිසා අමු ද්‍රව්‍ය සඳහාවූ විදේශ විනිමය වෙන් කිරීම අනුව පෞද්ගලික අංශයෙහි මෙම කර්මාන්තයන්හි කටයුතු රඳා පවතී. 1966 සහ 1967 සඳහා වූ විදේශීය විනිමය අයවැය ලේඛනය මෙන්ම 1968 සඳහා වූ කෙටුම්පත් අයවැය ලේඛනය මගින් ද, පෞද්ගලික අංශයෙහි කර්මාන්තයන් වෙනුවෙන් වැඩි වූ විදේශ විනිමය වෙන් කර ඇත. වැදගත් කමින් අඩු වූ කර්මාන්තයන් හි අනවශ්‍ය ප්‍රසාරණයක් ඇතිවීම වලකාලීම පිණිස සමහර කර්මාන්තයන් වෙනුවෙන් විදේශීය විනිමය වෙන් කිරීම, හිතාමතා පහළ මට්ටමක තබනු ලැබිය. එසේ වී නමුදු, පෙරට වඩා වැඩි වුවද, විදේශ විනිමය ප්‍රමාණයෙහි සමස්ත අප්‍රමාණවත් බව හේතු කොට ගෙන බොහෝ කර්මාන්තයන් ධාරිතා අවශ්‍යතාවයන්ට වඩා පහළ මට්ටමක පැවතුනි. මෙම වෙන් කිරීම්හි අඩුවීම් හැර මේවායේ කාල නිර්ණය ඒකාකාර නොවීමට හේතු වූයේ, වෙන් කිරීම් නියම වශයෙන් නිදහස් කිරීමට පෙරාතුව, විදේශ විනිමය පරිහරණය පිළිබඳව පරීක්ෂාකාරීව සොයා බැලීමේ අවශ්‍යතාවය නිසාය කෘෂිකාර්මික අංශයෙහි වේගවත් ආනයන ආදේශනයක් ලබාගන්නා ගමන්ම කාර්මික අංශය සඳහා වැඩි වූ විදේශ විනිමය පැහැදමක් කිරීමට හැකි තත්ත්වයක දිවයින පසුවිය යුතුය. මෙය, තෝරාගත් අමු ද්‍රව්‍ය ආනයනයන් ලිහිල් කිරීම් හා එක් කළහොත්, තමන්ගේ කටයුතු ඉටු කිරීමට හැකි තත්ත්වයක කාර්මික අංශය පැවතිය යුතුය. මෙයට හේතුව, කලින්ට වඩා වැඩි නිශ්පාදනයක් කිරීමේ දරිතාවයක් ඇති වන බැවිනි.

**මූල්‍ය - පිස්කල් ප්‍රතිපත්තිය**

මෑත කාලයේ දී අනුගමනය කරනු ලැබූ මූල්‍ය හා පිස්කල් ප්‍රතිපත්ති ආර්ථිකයේ අධික මූල්‍ය ප්‍රසාරණය පාලනය කිරීම පිණිස යොදන ලදී. 1965 දී මුදල් මණ්ඩලය විසින් මූල්‍ය විධිවිධාන කිහිපයක් ම පැන වූ අතර, මහ බැංකු පොලිය වැඩි කිරීම, ආන්තික සංචිත අනුපාතය ඉහල නැංවීම, බැංකු ණය පිළිබඳ උපරිමයන් පැනවීම යන මේවා එයට ඇතුලත් විය. මෙම විධිවිධාන තවදුරටත් බලපැවැත් වූ අතර, ඉන් අනතුරු මූල්‍ය තොරතුරු වලින් පෙනී යන්නේ, පෞද්ගලික අංශය වෙත වාණිජ බැංකු ණයෙහි අනවශ්‍ය වැඩිවීමක් සිදු නොවූ බවය. 1965 ජූනි අවසානයේ දී, රුපියල් දශ ලක්ෂ 1,650 ක්ව පැවති මුදල් සැපයුම, 1967 සැප්තැම්බර් අවසානය වන විට, රුපියල් දශ ලක්ෂ 1,700 දක්වා ඉහළ ගිය අතර, 1967 දෙසැම්බර් අවසානයේ දී රුපියල් දශ ලක්ෂ 1,808 දක්වා ඉහළ ගියේය. මෙය මාස තිහක කාලච්ඡේදයක දී වූ රුපියල් දශ ලක්ෂ 158 ක වැඩිවීමය. කෙසේ වුවද, සමස්ත මූල්‍ය සීමා කිරීම් මගින් පෞද්ගලික අංශයේ හිතකර ආයෝජනයන් අඩු කරලීමට ඉඩ නොදිය යුතුය. මෙම පරමාර්ථයෙන් යුතුව දැනටමත් ලංකාවේ සංවර්ධන මූල්‍ය කටයුතු නගා සිටුවීම පිණිස මහ බැංකුව විධිවිධානයන් යොදා ඇති අතර, මේ පිළිබඳව මෙම වාර්තාවේ පසුව විස්තර කර ඇත. මෙම යෝජනාවන් මගින්, 1968 දී සංවර්ධන මූල්‍ය කටයුතු වල ආයතනික සැකිල්ලෙහි වර්ධනයක් සිදු වෙතැයි බලාපොරොත්තු වේ.

1964/65 සිට 1966/67 අතර වූ අයවැය කටයුතු, ප්‍රසාරණාත්මක මුදල් මාර්ගයන් මත වැඩි වශයෙන් රැඳී නොමැති අතර, 1967 අවසාන කාර්තුවේ මූල්‍ය තොරතුරු වලින් පෙනී ගියේ, පිස්කල් කටයුතු සඳහා මුදල් යෙදවීමට බැංකුවල ආධාර අධික ලෙස සොයන බවය. මෙම ප්‍රවණතාවය පරීක්ෂාකාරී අන්දමින් සලකා බැලිය යුතුය. 1968 දී මූල්‍ය ප්‍රසාරණයක් පැවතුනහොත්, අවප්‍රමාණ කිරීමේ වාසි සහගත අනවශ්‍ය බලපෑම් නියත වශයෙන්ම මැකී යාමට හොඳටම ඉඩ තිබේ. පෞද්ගලික අංශයෙන් උද්ගත වන මෙවැනි ප්‍රසාරණාත්මක ප්‍රවනතාවයක්, දැනට මුදල් මණ්ඩලය මගින් අනුගමනය කරනු ලබන මූල්‍ය ප්‍රතිපත්ති රාමුව තුල පාලනය කොට තබාගත හැකිය. මේ නිසා අයවැය ලේඛනයෙන් මතු වන්නා වූ ප්‍රසාරනාත්මක ප්‍රවනතාවයන් ද පාලනයෙහි තැබීම එකසේ වැදගත්ය.

## (5) නිගමනය

අපනයන අංශයෙහි තවදුරටත් පිරිහීමක් පැවතියත්, 1967 වර්ෂයේදී ආර්-ථිකය හැඩ ගැසුණු ආකාරය 1966 පැවතියාට වඩා හැම අතින්ම සතුටු දායකය. 1967 ආර්ථික වර්ධනය ජන සංඛ්‍යාවේ ඉහළ යාම හා තරග කිරීමට සමත්වූවා සේම, මූර්ත ඒකජන නිෂ්පාදිතයෙහි වැඩිවීමක් ලබාදීමටත් පොහොසත් විය. මුදල් තත්ත්වය තවදුරටත් පාලනය කොට පැවතියත් වර්ෂය අවසානයේදී පමණ ඉක්මවූ ප්‍රසාරණයක් පිළිබඳ ලක්ෂණ පැවතුනි ආනයනය මගින් කළ සැපයුම් ප්‍රමාණය ඉකුත් වර්ෂයේ පැවතියාට වඩා පහල මට්ටමක පැවතියද සැපයුම් තත්ත්වය පෙරට වඩා සතුටුදායක විය. මිළ මට්ටම 1966 පැවතියාට වඩා තරමක් ඉහලින් පිහිටියේය. ගෙවුම් ශේෂ තත්ත්වය තවදුරටත් උද්වේග දනවන සුළුවිය. ආහාර ආනයන වෙනුවෙන් විදේශීය විනිමය සඳහා පැවති පීඩනය මැඩලීම සඳහා ගත් විධි විධාන වල ප්‍රතිඵල 1967 දී පෙනෙන්නට විය. ඒ අතර, කර්මාන්ත අංශයෙහි ආනයන ආදේශණයට අමුද්‍රව්‍ය ආනයනය සඳහා වැඩිපුර විදේශීය විනිමය වෙන් කිරීම මගින් සහාය දෙනු ලැබීය. ගෙවුම් ශේෂයේ පැවති මූලික අසමතුලිතතාවය හරිගැස්වීම සඳහා ගත් පියවරක් වශයෙන් 1967 නොවැම්බරයේදී රුපියල අවප්‍රමාන කරණු ලැබිනි. අවප්‍රමාන කිරීමේ සම්පූර්ණ ප්‍රතිඵල ලබා ගැනීමට නම් අනවශ්‍ය මුදල් ප්‍රසාරණයකට ඉඩ නොතබා, ආධාරක විධි විධාන යොද ගැනීම අවශ්‍ය වන්නේය.